The Journal of Archaeology and Heritage Studies (JAHS) 10 (I) 2023: 1-19 pp

The Journal of ARCHAEOLOGY & HERITAGE STUDIES

Journal Home page http://ssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# ස්වස්තික කාසිවල යෙදී තිබෙන සංකේත සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති මතවාද පිළිබඳ විමර්ශනයක්

**යූ.ඩී.ආර්. ෂෙහාන් තිලකරත්න**

පර්යේෂණ සහකාර, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය, පේරාදෙණිය. shehanthilakarathna1205@gmail.com

**සංක්ෂිප්තය**

ශ්‍රී ලංකාව පිළිබඳව අවධානය යොමු කිරීමේ දී මෙරට භාවිත මුල්ම කාසි වර්ගය වන්නේ හස් යෙදූ කාසි ය. ඉන්පසුව භාවිත වන ස්වස්තික කාසි අනුරාධපුර මුල් අවධියේ දී ශ්‍රී ලංකාවේ භාවිත වූ කාසි අතරින් දැනට වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇති කාසි වර්ගය වශයෙන් ද මෙරට මුල්ම අච්චු කාසි වර්ගය වශයෙන් ද සුවිශේෂී වේ. මෙම අධ්‍යයනයෙහි අරමුණ වන්නේ ස්වස්තික කාසිවල යෙදී ඇති සංකේත පිළිබඳව විද්වතුන් ඉදිරිපත් කර තිබෙන අදහස් පිළිබඳව විමර්ශනයක යෙදීමයි. මෙහි අධ්‍යයනය ගැටලුව වන්නේ ස්වස්තික කාසිවල යෙදී ඇති සංකේත ඇසුරින් එම කාසි වර්ගය දේශීය කාසි වර්ගයක් ලෙස හඳුනාගත හැකිද? යන්නයි. පුස්තකාලය ගවේෂණය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් යොදා ගැනුණි. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ කොළඹ ජාතික කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනයට තබා තිබෙන ස්වස්තික කාසි එකතුව අධ්‍යයනය කරන ලදි. ස්වස්තිකය, ගස, ඇතා, සිංහයා සහ අශ්වයා යන සංකේත ද චෛත්‍යය, ත්‍රිකෝණ සලකුණ, තිත් සලකුණ, නන්දිපාදය, අංකුසය ආදී සලකුණු ද ස්වස්තික කාසිවල අභිමුඛයේ සහ ප්‍රතිමුඛ යෙදී තිබෙණ සංකේත වේ. මේ එක් එක් සංකේතය පිළිබඳව විවිධ විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇති මතවාද පිළිබඳ විධිමත් සාකච්ඡාවක් මෙහි සිදු කෙරේ. ස්වස්තික සංකේතය ලොව බොහෝ සංස්කෘතිවල සුබ සලකුණක් ලෙසට සලකා තිබේ. එබැවින් හුදෙක් ස්වස්තිකය පමණක් පදනම් කර ගෙන බෞද්ධාගමික අර්ථකථනයක් ලබා දී ස්වස්තික කාසි ලංකාවට ආවේණික කාසි වර්ගයක් ලෙසට සැලකිය නොහැකි බව කතුවරයා මෙහි දී මතුකරන ප්‍රධානතම තර්කකයි.

**මුඛ්‍ය පද: නාණක විද්‍යාව, බෞද්ධ ස්වස්තිකය, වේදිය සහිත වෘක්ෂය, ස්වස්තික කාසි,**

ARTICLE INFO

*Article history:*
Received 06 February 2023
Accepted 05 January 2024
Available online 16 January 2024

## 1. හැඳින්වීම

ඉතිහාසය පිළිබදව අධ්‍යයනය කිරීමේ දී පාදක කරගනු ලබන මූලාශ්‍රය, සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක වශයෙන් ප්‍රධාන අංශ දෙකකට බෙදෙයි. කාසි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ගණයට අයත් වේ. කාසි පිළිබඳ අධ්‍යයනය කිරීම 'නාණක විද්‍යාව' (Numismatic) වශයෙන් හඳුන්වනු ලබයි. කාසි පිළිබඳව හදාරා ඒ පිළිබඳ පෘථුල දැනුමක් ඇති ශාස්ත්‍රඥයාව හඳුන්වන්නේ නාණක විද්‍යාඥයා (Numismatists) යනුවෙනි. කාසි පිළිබඳව පමණක් නොව මුදල්, නෝට්ටු, පදක්කම් (Medallion) සහ ලාංඡන (Token) පිළිබඳව හැදෑරීම ද නාණක



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

විද්‍යාවට අයත් වේ. ලෝහ භාවිතයෙන් කාසි නිර්මාණය කර තිබෙන නිසා පුරාණ කාලවල පැවති ලෝහ කර්මාන්තය, ඒ හා සම්බන්ධ තාක්ෂණය පිළිබඳව දැනුමක් පුරාවිද්‍යාඥයාට ලබා ගත හැකිය. කාල නිර්ණ සිදුකිරීමේ දී ද පුරාවිද්‍යාඥයාට කාසි මහගු පිටිවහලක් සපයයි. කාසියක්, පදක්කමක් හෝ ලාංඡනයක් නිර්මාණය වන්නේ සංස්කෘතික, ආර්ථික, දේශපාලනික, ආගමික හෝ සමාජයීය හේතුවක් පදනම් කර ගෙන ය. එබැවින් නාණක විද්‍යාත්මක අධ්‍යයන මගින් රටක හෝ ජාතියක ඉතිහාසය, සංස්කෘතිය, ආගමික හා සාම්ප්‍රදායික විශ්වාස හෝ ඇදහිලි සම්බන්ධ වැදගත් තොරතුරු රාශියක් අනාවරණය වෙයි.

මහාවංසය ඇතුළු සාහිත්‍යමය මූලාශ්‍රයවලින් ඓතිහාසික යුගයේ ආරම්භයේ සිට ම ශ්‍රී ලංකාවේ කාසි භාවිතයක් පැවති බවට කරුණු අනාවරණය වේ. ප්‍රථම වරට කාසි පිළිබඳව නාමිකව මහාවංසයේ සඳහන් වනුයේ එළාර රජු හා සබැඳි කතා ප්‍රවෘතියෙහි පහත පරිදි ය.

> "හෙතෙම එහි හුනු පසළොසක් පමණ ගල් (පියවි කොට) තමන්ම පසළොස් දහසක් කහවනු දුන්නේ ය" (මහාවංසය සිංහල, 2004: 90).

මෙම විස්තරය අනුව එළාර රජු විසින් සිය රථනාභිය මිහින්තලේ මහා සෑයෙහි වැදීම නිසා වූ අලාභහානිය වෙනුවෙන් කහවනු 15000ක් ගෙවා තිබේ. ක්‍රිස්තු පූර්ව යුගයට අයත් මෙරට ශිලා ලිපිවල ද කහාපණ, කහවන, කශපන ආදී වශයෙන් තත්කාලීනව මෙරට භාවිත වූ කාසි පිළිබඳව සඳහන් වෙයි. අනුරාධපුර ඇතුළුනුවර කැණීම්වලින් ක්‍රිස්තු පූර්ව යුගයට කාලනිර්ණය කරන ලද පස් ස්තරවල තිබී විවිධ කාසි අච්චු හමු වීම ද විශේෂ වේ (Deraniyagala, 1972; Plate 2, c & d). මේ අනුව මහාවංසයේ සඳහන් පරිදි ඓතිහාසික යුගය ආරම්භයේ සිට ම මෙරට කාසි භාවිතයක් තිබෙන්නට ඇති බවට සාධක ලැබේ. ලංකාවේ භාවිත වී ඇති පැරණිත ම කාසි වර්ගය වශයෙන් පිළිගන්නේ හස් යෙදූ කාසි ය. ඉන්පසුව මෙරට භාවිත වූ කාසි වර්ගය ලෙස සැලකෙන්නේ ස්වස්ථික කාසි ය. හස් යෙදූ කාසි නිෂ්පාදනය සම්බන්ධයෙන් කතා කිරීමේ දී ඒවාට ඉන්දියානු ප්‍රභවයක් පවතින බවට මතවාද ඉදිරිපත්ව තිබේ (කුලතුංග, 2015: 83-93, 172). නමුත් ස්වස්තික කාසිවල කාලය, අනන්‍යතාවය හා සම්භවය ගත්විට මෙරටට අනන්‍ය වූ කාසි වර්ගයක් බවට සැලකේ (ද සිල්වා, 2018: 24). අනුරාධපුර මුල් අවධියේ දී ශ්‍රී ලංකාවේ භාවිත වූ කාසි අතරින් දැනට වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇති ස්වස්තික කාසි වර්ගය, බෞද්ධ ස්වස්තික හෝ ඇතා සහ ස්වස්තික කාසි නමින් මූලාශ්‍රයවල බහුලව හඳුන්වා තිබේ. මෙම වර්ගයේ කාසි මුලින් ම සොයාගන්නා ලද්දේ හෙන්රි පාකර් විසින් තිස්සමහාරාමයෙනි (කුලතුංග, 2015: 170). මෙම කාසි නිෂ්පාදනය කිරීමේ දී ස්වස්තික සංකේතයට මූලිකත්වය ලබාදෙමින් නිෂ්පාදනය කර තිබෙන බවට පෙනීයන බැවින්, ස්වස්තික සංකේතය පදනම් කර ගෙන 'ස්වස්තික කාසි' යනුවෙන් මේවා හඳුන්වනු ලැබේ. ස්වස්තික සංකේතයට අමතරව වේදිය සහිත වෘක්ෂය, නන්දිපාදය, පර්වත සංකේතය, තිත් තුන ආදී තවත් සංකේත කිහිපයක් ම මෙම කාසිවල යෙදී ඇත. ඒ අනුව ස්වස්තික කාසිවල යෙදී ඇති සංකේත පිළිබඳව අවධානය යොමු කරමින් අධ්‍යයනයක් සිදුකිරීම වැදගත් වේ. 'ස්වස්තික' යන සංස්කෘත භාෂා ශබ්දයෙන් අදහස් කෙරෙන්නේ ශුභ ලක්ෂණය යි. එම ශබ්දය පාලි භාෂාවෙන් බිඳී එන්නේ 'සොවත්ථික' යනුවෙනි. 'සොත්ථි' යන්නෙන් අදහස් කරනුයේ යහපත, සැප හා ප්‍රීතිය යන්නයි (ගුණරත්න, 2019: 38).

ස්වස්තික සංකේතය සමඟ යෙදී ඇති අනෙකුත් සංකේත ද පදනම් කර ගෙන ස්වස්තික කාසිවල උපප්‍රභේද හතරක් හඳුනාගත හැකිය. ස්වස්තික කාසිවල යෙදී ඇති සංකේත පිළිබඳව මේ වන තෙක් නිශ්චිත වූ ඒකමතිකව පිළිගත් අදහසක් ඉදිරිපත්පත් වී නැත. ඒ සම්බන්ධයෙන් විවිධ මතවාද විවිධ උගතුන් විසින් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව මෙම ලිපියේ අරමුණ වන්නේ ස්වස්තික කාසිවල යෙදී ඇති සංකේත සම්බන්ධයෙන් ඉදිරිපත්ව තිබෙන මතවාද පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීමයි. මෙම කාසිවල යෙදී ඇති සංකේත අනුව ස්වස්තික කාසි දේශීය අනන්‍යතාවක් සහිත කාසි වර්ගයක් වන්නේ ද? යන්න මෙහි අධ්‍යයන ගැටලුව වේ.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය යන ක්‍රමවේද භාවිත කෙරිණි. ඒ අනුව පුස්තකාල අධ්‍යයනය ඔස්සේ

සාහිත්‍ය විමර්ශනයට අදාළ තොරතුරු එක්රැස් කරන ලදී. පුස්තකාලය පරිහරණය කොට නාණක විද්‍යාව සම්බන්ධයෙන් සිදුකර ඇති පූර්ව පර්යේෂණ, ගවේෂණ හා කැණීම් වාර්තා, පුවත්පත් ලිපි ආදිය පිළිබඳව විමර්ශනය කරන ලදී. ලංකාවේ විනිමය මාධ්‍යවල විකාශනය පිළිබඳ පූර්ව අවබෝධයක් ලබා ගැනීමට පුස්තකාල ගවේෂණය වැදගත් වේ. මෙහි දී මාතෘකාවට අදාළ බහුතරයක් සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය කිරීම සිදුකෙරිණි. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ මෙහි දී සිදුකරනු ලැබුවේ කොළඹ ජාතික කෞතුකාගාරයෙහි ඇති ස්වස්තික කාසි අධ්‍යයනයට බඳුන් කිරීමයි. ඒ අනුව කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබෙන ඇතා සහ ස්වස්තික කාසි 18ක් වත්මන් පර්යේෂකයා විසින් අධ්‍යයනයට බඳුන් කරන ලදී. එමගින් මෙම කාසිවල පවතින සංකේත පිළිබඳව සමීපව නිරීක්ෂණය කෙරිණි. වගු, රූක් සටහන් සහ ඡායාරූප භාවිතයෙන් තොරතුරු වර්ගීකරණය කළ අතර විශ්ලේෂණාත්මක හා සංසන්දනාත්මක අධ්‍යයනය මඟින් අර්ථකථනයන් සිදුකෙරිණි.

## 3. ප්‍රතිඵල

'ස්වස්තික කාසිවල යෙදී ඇති ස්වස්තික සංකේතය පමණක් පදනම් කර ගෙන එම කාසි වර්ගය ශ්‍රී ලංකාවට ආවේණික කාසි වර්ගයක් ලෙස පැවසිය නොහැකිය' යන්න මෙහි දී උපකල්පිතය ලෙස භාවිත කෙරිණි. කරුණු අධ්‍යයනයේ දී එම උපකල්පිතය සනාථ විය. මෙම ස්වස්තික කාසිවල ප්‍රතිමුඛයෙහි අනිවාර්යෙන්ම ස්වස්තික සංකේතය යෙදී ඇත. ඇතැම් විට අභිමුඛයේ ද ස්වස්තික සංකේතය දක්වේ. ස්වස්තිකය යෙදී තිබීමේ මෙම ප්‍රමුඛ ලක්ෂණය නිසා මේවා ස්වස්තික කාසි වශයෙන් හැඳින්වූ ද ස්වස්තිකයට අමතරව තවත් සංකේත රැසක් මෙම කාසි වර්ගයෙහි යෙදී ඇත. ඒවා නම් පර්වතය, ත්‍රිකෝණ සංකේතය, වේදිය සහිත ගස මෙන්ම ස්වස්තික කාසි උපවර්ගවලට බෙදීමේ දී මූලික කොටගත් අලියා, සිංහයා, අශ්වයා යන සත්ත්ව රූප ද නන්දිපාදය, ත්‍රිකෝණ සටහන, තිත් සලකුණ, ත්‍රිරත්නය යනාදියයි. මේ එක් එක් සංකේතවලින් අදහස් වන්නේ කුමක්ද? යන්න පිළිබඳව මේ වන තෙක් නිශ්චිත අදහසක් ඉදිරිපත් වී නැත. මෙවන් පසුබිමක දී හුදෙක් ස්වස්තික සංකේතය පමණක් පදනම් කර ගනිමින් එය බුදුදහම සමග සම්බන්ධ කර ස්වස්තික කාසි ස්වදේශික කාසි වර්ගයක් ලෙසින් ඇතැම්හු අදහස් ඉදිරිපත් කරති. ස්වස්තික සංකේතය ඇතුළුව ස්වස්තික කාසිවල යෙදී ඇති සියලුම සංකේත බහුසංස්කෘතික ලක්ෂණ පිළිබිඹු කරන සංකේත වන බවට මෙහි දී පෙන්වාදෙනු ලැබේ. ඒ අනුව ස්වස්තික කාසිවල යෙදී ඇති සංකේත ලොව විවිධ සංස්කෘතිවල විවිධ ආකාරයේ අදහස් ගැබ් කොට සංකේතාර්ථයෙන් භාවිත වී ඇත. ලංකාවේ ස්වස්තික කාසිවලට පෙර භාවිත වූ හස්යෙදූ කාසි සමග සැසඳීමේ දී නිර්මාණ තාක්ෂණය අතින් වෙනස්ව මෙරට මුල්ම අච්චු කාසි වශයෙන් ස්වස්ති කාසි සුවිශේෂී වේ. නමුත් එහි ඇති එක් සංකේතයක් පමණක් පාදක කර ගෙන ඒවා මෙරටට ම ආවේණික කාසි වර්ගයක් වශයෙන් සුවිශේෂී කොට දැක්වීමට නොපුළුවන. එම නිසා මෙරට භාවිත වී ඇති ස්වස්තික කාසි, ඒවායෙහි යෙදී ඇති ප්‍රමුඛ සංකේතය වන ස්වස්තික සංකේතය පමණක් ම පදනම් කර ගෙන, ඊට බෞද්ධාගමික අර්ථකථනයක් ලබා දෙමින් සෙසු සංකේත යොදා ගැනීමේ අදහස හෝ අර්ථය බැහැර කොට දේශීය කාසි වර්ගයක් ලෙස අර්ථකථනය කළ නොහැකි බවට නිගමනය කළ හැකිය.

## 4. සාකච්ඡාව

### 4.1. ස්වස්තික කාසි සහ එහි උපවර්ග

හස්යෙදූ කාසිවලින් ආරම්භ වූ පුරාණ ශ්‍රී ලංකාවේ කාසි භාවිත ඉතිහාසය පිළිබඳව හැදෑරීමේ දී ලක්ෂ්මී කාසි, සිංහ කාසි, වෘෂභ කාසි, මස්ස කාසි ආදී වශයෙන් කාසි වර්ග කිහිපයක් ම මෙරට භාවිත වී තිබෙන බවට හඳුනාගත හැකිය. මේ අතරට ම අයත් වන තවත් සුවිශේෂී කාසි වර්ගයක් වශයෙන් ස්වස්තික කාසි හඳුනා ගත හැකිය. අනුරාධපුර මුල් අවධියේ දී ලංකාවේ භාවිත වූ කාසි අතරින් වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇති කාසි වර්ගය වන්නේ ස්වස්තික කාසි ය (කුලතුංග, 1998: 27). ස්වස්තික කාසි සහ ලක්ෂ්මී කාසි ශ්‍රී ලංකාවේ මුල්ම අච්චු කාසි බවට ඉන්ද්‍රකීර්ති සිරිවීර පවසයි (සිරිවීර, 2014: 283). 'බෞද්ධ ස්වස්තික කාසි' හෝ 'ඇතා සහ ස්වස්තික කාසි' යන නම් නම්වලින් මේවා හඳුන්වනු ලැබේ. පුරාණ ශ්‍රී ලංකාවේ භාවිත කාසි පිළිබඳව අවධානය යොමු කිරීමේ දී හස් යෙදූ කාසිවලින් අනතුරුව මෙරට භාවිත වී තිබෙන්නේ ස්වස්තික කාසි ය. හෙන්රි පාකර් විසින් පළමු වරට මේ වර්ගයේ කාසි තිස්සමහාරාමයෙන් සොයාගෙන ඒ පිළිබඳ විස්තරයක් වර්ෂ 1884 දී රාජකීය ආසියාතික


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සඟරාවට (ලංකා ශාඛාව) සපයා තිබේ (කුලතුංග, 2015: 170). මිහින්තලේ, පුලියන්කුලම, ඉරණමඩු, මාතොට, වල්ලිපුරම්, අනුරාධපුරය වැනි ලංකාවේ ස්ථාන රැසකින් ම මෙම කාසි හමුවී ඇත. එච්.සී.පී බෙල්, ලීලානන්ද කල්දේරා, ඩී.පී.ඒ. හෙට්ටිආරච්චි, මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි ආදී විද්වත්හු ස්වස්තික කාසි 'බෞද්ධ ස්වස්තික කාසි' යනුවෙන් හැඳින්වීමට පෙළඹෙති. ඊට හේතුව වන්නේ මෙම කාසිවල වඩාත් කැපී පෙනෙන සංකේතය වශයෙන් යෙදී ඇති ස්වස්තිකයට බෞද්ධ දෘෂ්ටිකෝණාත්මක අර්ථකථනයක් ලබාදීමයි.

මෙම කාසි අතීත ලාංකික සමාජය තුළ කුමන නමකින් හැඳින්වීමට ලක්වූවේ ද යන්න නිශ්චිත නැත. ඒ පිළිබඳව සාක්ෂ්‍ය සාධක ද නොමැත. කොඩ්රින්ටන් 'හුණු' යනුවෙන් මෙරට පැරැණි මූලාශ්‍රයවල දැක්වෙන්නේ මෙම කාසි වර්ගය බවට අදහස් කරයි. ඔහු එම අදහස ඉදිරිපත් කරන්නේ පැරණි සිංහල බර මිණුම් ක්‍රම හා සසඳමින් ය (Codrington, 1924: 26). ක්‍රි. ව. දහවැනි සියවසට අයත් පළමු වන උදය රජුගේ ලිපියක 'පස් හුණක් රන් දී' යනුවෙන් සඳහන් වේ. දහතුන් වන සියවසට අයත් මයුරපාද පරිවේණාධිපති හිමිගේ යෝගාර්ණවයේ සිංහල බර මිනුම් ක්‍රම පිළිබඳව දක්වද්දී 'විසි මදටෙක් කළදෙක්, තුන් කළදෙක් හුනෙක්' යනුවෙන් මදටිය හැටක බර 'හුනක' බවට දක්වා තිබේ. මදටියක සාමාන්‍ය බර ග්‍රෙන්ස් 4.3ක් ලෙස ගනිමින් පැරණි හුන 'ග්‍රේන්ස් 60 x 4.3 = 258ක්' පමණ විය යුතු බවට කොඩ්රින්ටන් දක්වයි (Codrington, 1924: 8-11).

ස්වස්තික සංකේතය පදනම් කරගෙන 'බෞද්ධ ස්වස්තික' කාසි ලෙස මේවා හැඳින්වුව ද අතීත බැබිලෝනියාවේ ද වාසනාවේ සංකේතය ලෙස ස්වස්තිකය සලකා තිබේ (ගුණරත්න, 2019: 38). ස්වස්තික සලකුණින යෙදූ කාසි ලංකාවෙන් පමණක් හමු වී ඇත. වෙනත් කිසිදු රටක හමුවී නොමැත. එබැවින් මෙය ලංකාවට ම ආවේණික වූ කාසි වර්ගයක් වශයෙන් පිළිගැනේ (මැදගම, 2009: 46). ස්වස්තික කාසි ලංකාවට අනන්‍ය වූ වූ කාසි වර්ගයක් වීම පිළිබඳව ලීලානන්ද කල්දේරා මෙසේ විස්තර කරයි.

> "මෙම සලකුණු වලගම්බා රජු (ක්‍රි.ව. යෙන් යට 104 සහ 88-76) ගල්ලෙන කැරවූ සෙල්ලිපියකද, සැදෑතිස් රජු (ක්‍රි.ව. යෙන් යට 137-119) දඹුළු විහාරයෙහි කර වූ සෙල්ලිපියකද වේ. බෞද්ධ ස්වස්තික ලකුණු අප රටෙහි විනා අන් කිසිදු රටක ඇති බවක් නොපෙනේ. එහෙයින් එය අපට ම විශේෂ වූවකි. මෙරටට ම හිමි කාසි හැඳින ගැනීමට ඒ මහත් වහලකි. ඒ කාසියෙහි කිසි ද අකුරක් සටහන් නොවැ තිබීම කාලය සීමාකොට දැක්වීම බාධා කෙරෙයි. එහෙත් එය ක්‍රි. ව. යෙන් යට පළමුවන ශතවර්ෂයේ සිට ශතවර්ෂ හයක් පමණ ගත වන තුරු වැහැර විණැයි සිතිය හැක. ඒ සමයට අයත් නෂ්ටාවශේෂයන් හි තිබී සම්භවූ බැවිනි" (කල්දේරා, 1959: 7-8).

ස්වස්තික කාසි විෂ්කම්භයෙන් දළ වශයෙන් අඟල් එකහමාරකි. මේවා සම්බන්ධයෙන් කාල නිර්ණය කිරීමේ දී මෙම කාසි සමග හමු වූ අනෙක් පුරාවස්තු, කාසිවල දක්නට ලැබෙන සලකුණු හා විදේශීය කාසි යනාදිය නාණක විද්‍යාඥයෝ උපයෝගී කර ගනිති. කොඩ්රින්ටන් මෙම කාසි වර්ගය ක්‍රිස්තු පූර්ව අවධියට අයත් වන බවට පවසයි. ඒ භාරතයේ භාවිත වූ ඉතා පැරැණි කාසි විශේෂයක් වූ කුනීද කාසි හා සසඳමිනි (Codrington, 1924: 20). ලීලානන්ද කල්දෙරා පෙන්වාදෙන්නේ මේවා ක්‍රිස්තු පූර්ව 1 වන සියවසේ සිට 6 වන සියවස දක්වා මෙරට භාවිතයේ පැවති බවයි (කල්දේරා, 1959: 8). ස්වස්තික කාසිවල නිර්මාණ තාක්ෂණය කෙරෙහි අවධානය යොමු කරන විට ඒවා ධරණ කාසිවලට (හස්එබූ කාසිවලට) වඩා දියුණු තත්ත්වයක් පෙන්නුම් කරයි. ස්වස්තික කාසි ධරණ කාසිවලට වඩා පසුකාලීනව නිපද වූ බව එමගින් පැහැදිලි වේ. ඒ අනුව මේ කාසි වර්ගය නිෂ්පාදනයෙන් ක්‍රිස්තු පූර්ව 3 වන ශතකයට මෙහා මිස එහා විය නොහැකිය (කුලතුංග, 2015: 172). වාර්තා වී ඇති ස්වස්තික කාසි සියල්ල ම තඹ මිශ්‍ර ලෝහයෙන් නිර්මාණය කොට තිබේ. බොහොමයක් කාසි වෘත්තාකාර හැඩයක් ගනු ලබන අතර සතරැස් හැඩයන් ගෙන් ද සමන්විත කාසි ද පවතියි (බාලසූරිය, 2008: 15).


ගස, ඇතා, අශ්වයා සහ සිංහයා යන සංකේත සමග ප්‍රමුඛ සංකේතය ලෙසින් යෙදී ඇති ස්වස්තිකය පදනම් කර ගෙන ස්වස්තික කාසිවල උපවර්ග හතරක් පවතියි. ඒවා නම්,

i. ගස සහ ස්වස්තික කාසි
ii. ඇතා සහ ස්වස්තික කාසි
iii. අශ්වයා සහ ස්වස්තික කාසි


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

iv. සිංහයා සහ ස්වස්තික කාසි ය (බාලසූරිය, 2008: 14).

ගස සහ ස්වස්තික කාසි වාර්ගය බොහෝ දුරට හස්එබූ කාසි අනුගමනය කොට මුද්‍රා සංකේත යොදමින් නිර්මාණය කර තිබෙන බව පෙනේ. ක්‍රි.පූ. 190-160 අතර ඉන්දියාවේ සිටි ඇගතොක්ලීස්ගේ තඹ කාසියක ලක්ෂණ මෙම කාසි වර්ගයෙන් පිළිබිඹු වන බවට රැප්සන් ප්‍රකාශ කරයි (Rapson, 1897: 16). මෙහි අභිමුඛයෙහි වෘක්ෂ සංකේත දැකිය හැකිය. එම වෘක්ෂය නිරූපණය කොට තිබෙන්නේ අතු විහිදී ගියා ආකාරයෙනි. එය හස්එබූ කාසිවල දක්නට ලැබෙන ස්වරූපයට සමාන වේ. මෙහි දී වෘක්ෂය දැක්වෙන්නේ වේදියක් සහිත ව ය (රූප සටහන් අංක 01 සහ 02).




රූප සටහන් අංක 01 - ගස සහ ස්වස්තික කාසියක යෙදී ඇති සංකේත - පරිමාණයට නොවේ.


මෙම වෘක්ෂ සංකේතය සමග දැක්වෙන වේදිය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එය ස්වරූප කිහිපයක්කින් නිරූපිතව තිබේ.

i. සම සතරැස් කොටුවක් හතරකට බෙදී ගිය ආකාරයට
ii. සමසතරැස් කොටුවක් සිරස් ඉරි කැබලි කිහිපයකින් බෙදා ඇති ලෙස
iii. සම්පූර්ණ කොටුවම කොටු කිහිපයකට බෙදී යන ආකාරයට (රූප සටහන 03).


වෘක්ෂ සංකේතයේ වේදිය දක්වා තිබෙනු මෙම කාසි වර්ගය පරීක්ෂා කිරීමේදී දැකගත හැකිය. අභිමුඛයෙහි දැක්වෙන මෙම වේදිය සහිත වෘක්ෂ සංකේතයෙහි වේදිය පමණක් නොව වෘක්ෂය ද විවිධ ස්වරූපයෙන් නිරූපිතව ඇත (රූප සටහන් අංක 04).




රූප සටහන් අංක 02- ගස සහ ස්වසතික කාසිවල ගස සහ වේදිය විවිධ ස්වරූපයන්ගෙන් නිරූපිතව ඇති ආකාරය (වනිගසේකර, 1987: 62) - පරිමාණයට නොවේ.




රූප සටහන් අංක 03 - ගස සහ ස්වස්තික කාසිවල යෙදෙන වේදිය සහිත වෘක්ෂ සංකේතයෙහි වේදිය විවිධාකාරයෙන් නිරූපණය කර තිබීම - පරිමාණයට නොවේ.




රූප සටහන් අංක 04 - ගස සහ ස්වස්තික කාසිවල යෙදෙන වේදිය සහිත වෘක්ෂ සංකේතයෙහි වෘක්ෂය විවිධාකාරයෙන් නිරූපණය කර තිබීම. (i) සිරස් ඉරක් ගසේ කඳ ලෙස යොදා අතු ලෙස ද සෘජු ඉරි යොදා නිරූපණය කිරීම. (ii) අතු තුනක් කුඩා අතු කිහිපයකින් බෙදී යන ස්වරූපයෙන් දැක්වීම. (iii) වටකුරු හැඩ සහිත පත්‍රවලින් නිරූපණය කිරීම (වනිගසේකර, 1987: 62) - පරිමාණයට නොවේ.




රූප සටහන් අංක 05 - ඇතා සහ ස්වස්තික කාසි මත සංකේත ස්ථානගත වී ඇති ආකාරය - පරිමාණයට නොවේ.

මෙම ගස සහ ස්වස්තික වර්ගයේ කාසිවල වේදිය සහිත ස්වස්තිකය දක්වෙන්නේ ප්‍රතිමුඛයෙහි ය. බොහෝ විට එම ස්වස්තික සංකේතය දකුණු පසට භ්‍රමණය වී ඇති ලෙසින් නිරූපිත ය. එය දෙපස නන්දිපාද, චෛත්‍ය සංකේතය වැනි තවත් සංකේත කිහිපයකි. ශ්‍රී ලංකාවේ කන්තරෝදය, වල්ලිපුරම්, කතරගම සහ අනුරාධපුර ප්‍රදේශවලින් මෙම කාසි හමු වී ඇත (වනිගසේකර, 1987: 64).


ඇතා සහ ස්වස්තික කාසි හස්යෙදු කාසිවල ම නවීකරණයක් ලෙස හඳුන්වයි. ස්ටිල් මෙම කාසි හස්යෙදු කාසිවල ඉක්මන් ජයග්‍රහණයක් බවට ප්‍රකාශ කරයි (වනිගසේකර, 1987: 64). මෙම කාසි වටකුරු ය. තඹවලින් නිෂ්පාදිත ය. අභිමුඛයෙහි සංකේත පහකි. වෘත්තාකාර කාසිය මත එම සංකේතවල පිහිටීම 'රූප සටහන් අංක 05' පරිදි පෙන්වාදිය හැකිය. ස්වස්තිකය, ත්‍රිකෝණාකාර සංකේතය, හස්තියා, චෛත්‍යය, ශාඛා තුනකින් යුත් වෘක්ෂය යනාදී සංකේත මෙම වර්ගයේ දී දකගත හැකිය. කොඩ්රින්ටන් පෙන්වා දෙන්නේ මෙම වර්ගයේ කාසිවල සංකේත හතරක් ඇති බවයි. ඔහු ත්‍රිකෝණ සංකේතය පිළිබඳව සඳහන් කර නැත (Codrington, 1924: 20). මෙම කාසිවල ස්වස්තිකය, චෛත්‍යය, නන්දිපාදය දෙක යන සංකේත හතර ප්‍රතිමුඛයෙහි දැක්වේ. ඒවා 'රූප සටහන් අංක 05' පරිදි වෘත්තාකාර කාසිය මත ස්ථානගතව පිහිටා තිබෙන ආකාරය දළ වශයෙන් පෙන්වා දිය හැකිය.

මේ වර්ගයේ තඹ කාසි තිස්සමහාරාමය, මාතොට, කන්තරෝදය, පුලියන්කුලම, අනුරාධපුර අභයගිරිය, මිහින්තලය, වල්ලිපුරම සහ ඉරණමඩු වැනි ප්‍රදේශවලින් වාර්තා වී ඇත. හෙන්රි පාකර්ට අනුරාධපුරයෙන් හමු වූ කාසියෙහි ප්‍රතිමුඛය අපැහැදිලි ය. නමුත් අභිමුඛය ඉතා පැහැදිලිව හඳුනාගත හැකි සංකේතවලින් යුතුය. එහි විෂ්කම්භය අඟල් 1.47 කි. බර ග්‍රේන්ස් 232කි. පාකර්ට මිහින්තලයෙන් හමුවූ කාසිය විශ්කම්භයෙන් අඟල් 1.31කි. බර ග්‍රේන්ස් 264කි (Paker, 1999: 504-505). ඇතා සහ ස්වස්තික කාසි වර්ගයේ මධ්‍යම ප්‍රමාණයේ සහ කුඩා ප්‍රමාණයේ කාසි වාර්තා වී ඇත. මධ්‍යම ප්‍රමාණයේ තඹ කාසි අඟලක පමණ විෂ්කම්භයෙන් යුතුය. කුඩා තඹ කාසිවල විශ්කම්භය සෙන්ටි මීටර් එකක් පමණ වේ. ඒවායේ එක් පැත්තක අනිවාර්යෙන්ම වේදිය සහිත ස්වස්තික සංකේතය දක්වේ. එම නිසා එම සංකේතය කාසි නිකුත් කළ බලධාරියාගේ මුද්‍රා විය හැකිය (කුලතුංග, 1998: 168). දමයන්ති කුමාරි වනිගසේකර මෙම කාසි වර්ගයට අයත් සාමාන්‍ය තත්ත්වයක පවතින කාසි කිහිපයක විෂ්කම්භය හා බර ප්‍රමාණ දක්වා තිබේ (වගුව 1). මේ අනුව ඉතා හොඳින් ශේෂව ඇති කාසියක් ග්‍රේන්ස් 260ක පමණ බරකින් යුක්ත වේ (වනිගසේකර, 1987: 68)

**වගුව 1. කාසි විෂ්කම්භය හා බර ප්‍රමාණ**

| "විෂ්කම්භය (අඟල්වලින්) | බර (ග්‍රේන්ස්වලින්) |
|---|---|
| 1.37 | 244.8 |
| 1.41 | 230.4 |
| 1.35 | 217.9 |
| 1.33 | 257.7 |

ඇතා සහ ස්වස්තික කාසි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර ඇතුළුනුවර කරන ලද කැණීම්වලින් සොයාගෙන තිබේ. ඒවා හමුවී තිබෙන්නේ ක්‍රි.පූ. 4-3 සියවස් අතරට කාලය නිර්ණය කරන ලද ස්තරවලිනි (කුලතුංග, 1998: 168).




**රූප සටහන් අංක 06 - ඇතා සහ ස්වස්තික කාසියක යෙදී ඇති සංකේත** (Hettiaratchi, 1965: Fig. 5) - **පරිමාණයට නොවේ.**

අශ්වයා සහ ස්වස්තික කාසි වර්ගය 'ඇතා සහ ස්වස්තික කාසි' වර්ගයට සමාන ය. නමුත් ඒවාට වඩා ඝනකමින් අඩු ය. මෙම කාසි වර්ගය කන්තරෝදයෙන් හමුව තිබේ. මෙම කාසිවල අභිමුඛයෙහි අශ්වයකුගේ යැයි අනුමාන කරන රූපයකි. එම අශ්වයා නිරූපණය

කොට තිබෙන්නේ දකුණු දෙසට යොමු වී සිටින ආකාරයෙනි. අන්තරයන්හි කුඩා තිත් සමූහයක් ද දැකිය හැකිය. ප්‍රතිමුඛයෙහි ස්වස්තිකය දැක්වේ. නමුත් එය අපැහැදිලිය. මෙම කාසි වර්ගයේ විෂ්කම්භය අඟල් 1.49කි. බර ග්‍රේන්ස් 109.4කි (වනිගසේකර, 1987: 69).

සිංහයා සහ ස්වස්තික කාසි ප්‍රමාණයෙන් කුඩා ය. අභිමුඛයේ කේශර රහිත සිංහ රුව දකුණු දෙසට හැරී සිටින ආකාරයෙන් නිරූපිත වෙයි. ඔහුට ඉහළින් හෝ පහළින් චෛත්‍ය සංකේතය දැක්වේ. ප්‍රතිමුඛයෙහි ඇත්තේ දකුණට භ්‍රමණය වී ඇති ස්වස්තිය සංකේතයයි (බලන්න රූප සටහන් අංක 07). පී.ඊ. පීරිස් කන්තරෝදයෙන් සොයාගත් මේ වර්ගයේ කාසිවල ආදර්ශ, විශ්කම්භය හා බර පිළිබඳ දක්වා තිබේ. ඒ අනුව බර ග්‍රේන්ස් 25.6ක් ද විශ්කම්භය අඟල් 47 x .55ක් ද වේ (වනිගසේකර, 1987: 69).



**රූප සටහන් අංක 07 - සිංහයා සහ ස්වස්තික කාසියක යෙදී ඇති සංකේත - දළ රූප සටහනක්.**

අනුරාධපුර ජේතවනාරාමයෙන් ගස සහ ස්වස්තික කාසි, ඇතා සහ ස්වස්තික කාසි යන වර්ග දෙක වාර්තා වී ඇත (බාලසූරිය, 2000: 22). ඒවා ස්තූප මළුවෙන් වාර්තා වී ඇති අතර අනෙක් පැරණි දේශීය කාසි සමග සසඳන විට ඒවා හමු වී තිබෙන්නේ අඩු ප්‍රමාණයකි. ජේතවන ස්තූප මළුවෙන් රවුම් සහ හතර හැඩ කාසි ද හමු වී ඇත.

> “මෙම කාසි බොහෝ සෙයින් ම වාර්තා වී ඇත්තේ ප්‍රාග් ජේතවන අවධිය තුළින් වීම විශේෂ වේ. හස් එබූ කාසි හමුවන ගැඹුරු මට්ටම්වල දී මෙම කාසි හමුවීම මගින් බොහෝ විට ක්‍රිස්තු පූර්ව 3-2 කාලයේ මෙම කාසි භාවිත වන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය” (බාලසූරිය, 2009: 58).

## 4.2. ස්වස්තික කාසිවල යෙදී ඇති සංකේත

ස්වස්තික කාසිවල යෙදී තිබෙන සංකේත කෙරෙහි අවධානය යොමුකිරීමේ දී ප්‍රධාන වශයෙන් සංකේත කිහිපයක් හඳුනාගත් හැකිය. ප්‍රධාන සංකේතය වන ස්වස්තිකය සහ උපවර්ග බෙදීමට පදනම් කර ගත් ඇතා, වෘක්ෂය, සිංහයා (කේශර රහිත) සහ අශ්වයා යන සංකේත ද චෛත්‍යය, ත්‍රිකෝණ සලකුණ, තිත් සලකුණ, නන්දිපාදය, අංකුසය ආදී සලකුණු ද අභිමුඛයේ සහ ප්‍රතිමුඛ යෙදී තිබෙණු දැකගත හැකිය. සංකේත සියල්ල වෘත්තාකාර රාමුවක් තුළ නිරූපණය කර ඇත. ආභිමුඛයෙහි කාසිය වටා රවුම් රේඛා දෙකක් දැක්වේ. ඒ දෙක අතර පරතරය අඟල් 1/10ක් පමණ වේ. එම පරතරය රේඛාවලට සමාන්තරව කඩින් කඩ තිත් සහිතව දිවෙන තවත් රේඛාවක් ද දැකගත හැකිය (කුලතුංග, 2015: 177). ස්වස්තික කාසිවල දක්නට ලැබෙන ඇත් රූපය, ත්‍රිශූලය, තිත් සලකුණ, කන්ද සංකේතය යනාදිය හස්යෙදූ කාසිවල දක්නට ලැබෙන සංකේතවලට සමාන ය.

ගස සහ ස්වස්තික කාසිවල අභිමුඛයෙහි වේදිය සහිත වෘක්ෂය දක්වෙයි. එය හස්යෙදූ කාසිවල දක්නට ලැබෙන ස්වරූපයට සමාන ය. ගස සහ ස්වස්තික කාසිවල දක්වෙන වේදිය සහිත වෘක්ෂය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී වේදියේත්, වෘක්ෂයේත් වෙනස්කම් සහිතව විවිධතාවයෙන් යුක්තව යෙදී තිබෙනු හඳුනාගත හැකිය. එම වෙනස්කම් පිළිබඳව ඉහත අනුමාතෘකාව යටතේ දී කරුණු සාකච්ඡා කර ඇත. මෙම ගස සහ ස්වස්තික කාසි වර්ගයෙහි අභිමුඛයෙහි ප්‍රධාන සංකේතය වශයෙන් යෙදී තිබෙන්නේ වේදයක් සහිත වෘක්ෂය පමණි. ප්‍රතිමුඛයෙහි වේදිය සහිත ස්වස්තිකය, එය දෙපස නන්දිපාදය, චෛත්‍ය සංකේතය වශයෙන් සංකේත කිහිපයක් දැකගත හැකිය (ඡායාරූප අංක 01). මෙහි දී ස්වස්තිකය බොහෝ විට දකුණට භ්‍රමණය වී තිබේ.

අශ්වයා සහ ස්වස්තික කාසිවල අභිමුඛයෙහි දකුණු දෙසට මුහුණ ලා සිටින අශ්වයක් වේ. එම අශ්වයාට ඉහළින් වේදිය සහිත වෘක්ෂ සංකේතය දැක්වේ. කාසියේ හිස් අවකාශය පූර්ණය කිරීමට තිත් සලකුණු යොදා ඇත. ප්‍රතිමුඛයෙහි වේදිය සහිත ස්වස්තිකය දක්නට ලැබේ. මේ වර්ගයේ කාසිවල ප්‍රතිමුඛයේ තවත්

සංකේත තිබෙන බවට පෙනුන ද ඒවා හඳුනා ගැනීමට නොහැකි තරමට බොහෝ සෙයින් අපහැදිලිය.



**ඡායාරූප අංක 01 - ගස සහ ස්වස්තික කාසියක්** (*Wickramasinhe, 2001*).

අශ්වයා සහ ස්වස්තික කාසිවල අභිමුඛයෙහි දකුණු දෙසට මුහුණ ලා සිටින අශ්වයක් වේ. එම අශ්වයාට ඉහළින් වේදිය සහිත වෘක්ෂ සංකේතය දැක්වේ. කාසියේ හිස් අවකාශය පූර්ණය කිරීමට තිත් සලකුණු යොදා ඇත. ප්‍රතිමුඛයෙහි වේදිය සහිත ස්වස්තිකය දක්නට ලැබේ. මේ වර්ගයේ කාසිවල ප්‍රතිමුඛයේ තවත් සංකේත තිබෙන බවට පෙනුන ද ඒවා හඳුනා ගැනීමට නොහැකි තරමට බොහෝ සෙයින් අපහැදිලිය.

සිංහයා සහ ස්වස්තික කාසිවල අභිමුඛයෙහි ප්‍රධාන සංකේතය වී තිබෙන්නේ කේශර රහිතව නිරූපිත සිංහයා ය. එම දකුණු දෙසට හැරී සිටි සිංහයාට ඉහළින් හෝ පහළින් අඩසඳ තුනක් සහිත කන්ද සංකේතය දැක්වේ. මෙම වර්ගයේ දී ප්‍රතිමුඛයෙහි වෘක්ෂ සංකේතය දැකිය නොහැකිය. ඒ වෙනුවට ඇත්තේ කන්ද සංකේතයයි. ප්‍රතිමුඛයෙහි දකුණට භ්‍රමණ වූ වේදිය සහිත ස්වස්තිකය දැක්වේ (ඡායාරූප අංක 02). ස්වස්තික කාසිවලින් පසුව මෙරට භාවිත වී ඇති සිංහ කාසිවල යෙදී ඇති සංකේත, සිංහයා සහ ස්වස්තික කාසිවල යෙදී ඇති මෙම සංකේත සමග සසඳන විට මෙම සිංහයා සහ ස්වස්තික කාසි වර්ගයේ ආභාසය සිංහ කාසි සඳහා ලැබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

ඇතා සහ ස්වස්තික කාසි වර්ගය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ඒවා අවස්ථා කිහිපයක දී ම විවිධ අච්චුවල මුද්‍රණය කර ඇති බවට අනුමාන කළ හැකිය. ඊට හේතුව වන්නේ බොහොමයකම සලකුණු මුද්‍රණය කිරීමේ දී ඇති වී තිබෙන වෙනස්කම් ය. එම වෙනස්කම් ප්‍රධාන වශයෙන් පෙනෙන්නේ ඇතා, නන්දිපාදය, ත්‍රිරත්නය, අංකුසය ආදී සංකේතවල ය. මේ වර්ගයේ කාසිවල අභිමුඛයෙහි රේඛාවකින් වට වූ සලකුණු හයක් දැකිය හැකිය. ඒවානම් ඇතා, වේදිය සහිත ස්වස්තිකය, වෘක්ෂය, පර්වතය, තුන්කොන් සලකුණ, තිත් සලකුණ යනුවෙනි. ප්‍රතිමුඛයෙහි එක් රේඛාවකින් පමණක් වට වූ පසුබිමක දක්නට ලැබෙන සංකේත වනුයේ වේදිය සහිත ස්වස්තිකය, පර්වතය, තුන්කොන් සටහන් දෙකක් එකට බැඳුණු සලකුණ, නන්දිපාදය, අංකුසය සහ තිත් සලකුණ යනාදියයි. බොහෝ කාසිවල මෙම සලකුණු දක්නට ලැබුණත් ඇතැම් කාසිවල විවිධ වෙනස්කම් දැකිය හැකිය. මේ සංකේතවල ඇති වෙනස්කම් අනුව ඒවා මෙසේ වර්ග කළ හැකිය.



**ඡායාරූප අංක 02 - සිංහයා සහ ස්වස්තික කාසියක්** (*Wickramasinhe, 2001*).

i. ඇතා සිටින දිශාව අනුව
ii. ඇත් රූපය නිර්මාණය කර ඇති ආකාරය අනුව
iii. කාසියේ දෙපසම ඇත් රූපය සටහන් වී ඇති ආකාරය අනුව
iv. ස්වස්තික සලකුණ පිහිටා ඇති දිශාව අනුව
v. ස්වස්තික සංඛ්‍යාව අනුව
vi. ගරාදි වැටට පහළින් පිහිටා ඇති තිරස් රේඛා සංඛ්‍යාව අනුව
vii. පර්වත සලකුණේ ඇති විවිධ වෙනස්කම් අනුව
viii. අංකුසය හා ශ්‍රීවත්ස්‍ය සලකුණ ඇති හෝ නැති බව අනුව


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ix. නන්දිපාද හෝ ත්‍රිරත්න සලකුණේ ඇති වෙනස්කම් අනුව
x. එකට බැඳුණු ත්‍රිකෝණ සලකුණු දෙකක සංකේතයේ ඇති වෙනස්කම් අනුව
xi. කාසිය වටා ඇති රේඛාවල වෙනස්කම් අනුව (විරාජිනී, 2010: 38).

ඇතා සහ ස්වස්තික කාසි වර්ග ප්‍රධාන සංකේතය වන්නේ ඇත් රූපය යි (ඡායාරූප අංක 03). මෙය වැඩි වශයෙන් යෙදී තිබෙන්නේ කාසියෙහි අභිමුඛයෙහි ය. එහෙත් ඇතැම් කාසිවල අභිමුඛ, ප්‍රතිමුඛ දෙපැත්තේම එය යෙදී තිබෙනු දැක ගත හැකිය (කුලතුංග, 2105: 204). මෙම ඇත් රූපයෙහි ද වෙනස්කම් හඳුනාගත හැකිය. ඇතා දකුණු පසට හැරී සිටින ලෙසින් ද වම් පසට හැරී සිටින ලෙසින් ද කාසිවල නිරූපිණය වී තිබේ. වේදිය සහිත ස්වස්තිකය ද වාමාවෘත්තව හෝ දක්ෂිණාවෘත්තව සටහන් කර තිබේ. මීට අමතරව එකම කාසියේ වේදියට සම්බන්ධ කළ ස්වස්තික සලකුණු දෙකක් පෙනෙයි. මෙවැනි කාසි ඉතා දුර්ලභය. මෙය ඇතැම් විට විශේෂ නිෂ්පාදනයක් වන්නට ඇත. එසේත් නැත්නම් නිෂ්පාදනයේ දී සිදු වූ වෙනසක් විය හැකිය (විරාජිනී, 2010: 39).

අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ යෙදී ඇති තිත් තුනේ සලකුණ එකක් පමණක් වශයෙන් ද කිහිපවරක් වශයෙන් ද යෙදී තිබෙන අවස්ථා දැකගත හැකිවේ. මේ අනුව එම සංකේතය හිස් අවකාශය පිරවීමට යොදා ගනු ලැබූවක් බවට අදහස් කෙරේ. මේ වර්ගයේ සැම කාසියකම පර්වත සලකුණ දැකිය හැකිය. එය කාසියේ අභිමුඛයේ මෙන් ම ප්‍රතිමුඛයේ ද යෙදී ඇත. මෙහි ද යම් යම් වෙනස්කම් හඳුනාගත හැකිය.

අභිමුඛයේ ඇති මෙම සංකේතය කවය පහතට හැරුණු අඩකව දෙකකින් ද ඒ මතුපිට ඒ ආකාරයෙන් ම ඇති අඩකවයකින් ද සැදුම් ලද්දකි. අභිමුඛයේ ඇති මෙම සලකුණේ පහතින් ඇති අඩකව දෙක එකට බැඳී ඇත. එහෙත් ප්‍රතිමුඛයේ ඇති සලකුණෙහි පහතින් ඇති අඩකව දෙක එකිනෙකින් වෙනස් වී තිබේ. මීට අමතරව මේ වර්ගයේ සමහරක් කාසිවල පර්වත සංකේතයට යටින් ඉරි තුනක් සටහන් වී නැත. තවද ප්‍රතිමුඛයේ දක්නට ලැබෙන තුන්කොන් සටහන් දෙකේ ද විවිධ වෙනස්කම් පවතියි. සමහර කාසිවල ත්‍රිකෝණ දෙක එකිනෙකට ඇත්තව පිහිටා ඇත. මෙම වෙනස්කම් මුද්‍රණයේ දී ඇති වෙනස්කම් ලෙස සැලකේ. තවද ඇතැම් කාසිවල ප්‍රතිමුඛයෙහි අංකුසය හා ශ්‍රීවත්ස්‍ය සලකුණ සටහන් තිබෙන අතර ඇතැම් කාසිවල ඒවා සටහන් වී නැත. ඇතා සහ ස්වස්තික කාසි මත ඇති සංකේතවලට සමාන සංකේත ඉතා වැඩි ප්‍රමාණයක් උජ්ජෙයිනි කාසියවල දක්නට ලැබේ (කුලතුංග, 2015: 173).

උගතුන් විසින් ස්වස්තික කාසිවල ඇතුළත් මෙම සංකේත ඇසුරින් ඒවායේ කාලය පිළිබඳ නිගමනයන්ට එළඹීමට ද උත්සාහ දරන ලදී. එහිදී බ්‍රාහ්මී නොවන සංකේත, බ්‍රාහ්මීය අක්ෂර භාවිතයට පෙර මෙරට භාවිතයේ පැවති අක්ෂර විශේෂයක් බවට පරණවිතාන දක්වා ඇති මතය පාදක වෙයි. එකී මතයට අනුව ස්වස්තික කාසි නිෂ්පාදන වකවානුව ක්‍රිස්තු පූර්ව තුන්වැනි සතකයට මෙහා මීස එහා විය නොහැකිය (කුලතුංග, 2015: 172).

### 4.3. ස්වස්තික කාසිවල යෙදී ඇති සංකේත පිළිබඳව ඉදිරිපත්ව ඇති මතවාද


ස්වස්තික කාසි පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී එම කාසිවල දක්නට ලැබෙන සංකේත මොනවාද? ඒවායින් අදහස් වන්නේ කුමක්ද? යනාදී ප්‍රශ්න පිළිබඳව අවධානය නිතැතින්ම යොමු වේ. එම ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් විද්වතුන් විවිධ මතවාද ඉදිරිපත් කර



ඡායාරූප අංක 03 - කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශිත ඇතා සහ ස්වස්තික කාසි (ඡායාරූපකරණය: මලිත් ද සිල්වා, 03/02/2023)


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk


ඇත. ඒ සඳහා විවිධ වූ සාක්ෂ්‍ය සාධක පදනම්ව තිබේ. කෙසේනමුත් ස්වස්තික කාසිවල ඇති සංකේතයන් ගෙන් ප්‍රකාශිත වන්නේ කුමන අදහසක් ද? යන්න පිළිබඳව මේ වන තෙක් පිළිගත් නිශ්චිත මතයක් නැත. එබැවින් ඒ පිළිබඳව අධ්‍යයනයට ලක් කළ හැකි වන්නේ එම සංකේත පිළිබඳව උගතුන් දක්වා ඇති නොයෙකුත් මතවාදාත්මක අදහස් රාශියක් පිළිබඳව ය.



**රූප සටහන් අංක 08 - ත්‍රිකෝණ සලකුණු - පරිමාණයට නොවේ**

ස්වස්තික කාසි අතර ඉතා ප්‍රචලිත උපවර්ගය වන්නේ ඇතා සහ ස්වස්තික කාසි ය. එබැවින් බොහෝ විද්වතුන් ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබේ. මෙම කාසි වර්ගයෙහි ඉහත රූප සටහන් අංක 08හි දැක්වෙන (i) හා (ii) යන සලකුණු දැකිය හැකිය. මෙම සංකේත ඉන්දියාවේ උදේනි කාසිවල ද දැකිය හැකිය. එමෙන් ම එහි සුළු වෙනස්කමක් සහිතව ඉහත රූප සටහන් අංක 08හි දැක්වෙන (iii) ආකාරයෙන් ද උජ්ජෙයිනි කාසියක මේ සංකේතය හඳුනාගත හැකිවේ. එහි දී එම සංකේතයට වේදියක් එකතු කර තිබේ. එයින් ගම්‍ය වන්නේ එයට පූජනීය බවක් ආරෝපණය කර ඇති බවකි. එවැනි එක් ත්‍රිකෝණාකාර සංකේතයක් තුළ ටෝරීන් සලකුණ ද යොදා තිබෙනු දැකිය හැකිය (ඉහත රූප සටහන් අංක 08හි දැක්වෙන (iv) ආකාරයට). මෙම සලකුණ බ්‍රාහ්මීය සලකුණක් වශයෙන් ඇතැම්හු සලකති. මෙම සංකේතය ඉන්දියානු ග්‍රාමීය ශිව දේවාලවල සවි කර තිබෙනු දක්නට ලැබේ (කුලතුංග, 2015: 174). කෙසේවෙතත් ස්වස්තික කාසිවල ඇති වේදිය සහිත ස්වස්තික සලකුණ හැරුණු විට අනෙකුත් සංකේත උදේනි සහ මගධ කාසිවල දැකිය හැකිය. සාංචියේ කැණීම්වලින් හමු වූ මාල දෙකක පෙති වශයෙන් ශ්‍රී වත්ස, මත්ස්‍ය යුගල, එරසු, අංකුසය, දර්පණ, නන්දිපාද, අසිපත, සූර්යයා, කල්ප වෘක්ෂය යනාදී සලකුණු මාලයේ පෙති වශයෙන් අල්ලා තිබේ. එම සලකුණු එකල්හි මංගල වස්තු වශයෙන් පිළිගත් ඒවා බවට පැහැදිලිය (කුලතුංග, 2015: 175). එම සලකුණු අතර ද ස්වස්තික කාසිවල යෙදී ඇති මෙම සංකේතයට සමාන සංකේත දෙකක් දක්නට ලැබේ (රූප සටහන් අංක 08හි දැක්වෙන v සහ vi). මේ පිළිබඳව ටී.ජී. කුලතුංගගේ අදහස මෙසේ ය.

> “පුරාතන ඉන්දියාවේ හා ඉන්දියානු සංස්කෘතිය පැතිරී ගිය තදාසන්න රටවල පුරාණයේ සිට ම මිනිසාගේ යහපත, සෞභාග්‍යය, ආරක්ෂාව සළසා දෙන මංගල සම්මත වස්තු මෙන් මංගල වචන භාවිතය පැවතුණි. ...පුරාණ භාරතයේ පිළිගත් මංගල සංකේත එහි ම පසුකාලයක වනවිට බෞද්ධයින් විසින් ද පිළිගෙන ඇති ආකාරය බෞද්ධ කැටයම් අතර එම සංකේත දක්නට ලැබීමෙන් තහවුරු වේ. භාරතයේ හා ශ්‍රී ලංකාවේ කාසි මත ද දක්නට ලැබෙන සංකේත බොහොමයක් ම මෙකී මංගල සම්මත ලකුණු හෙයින් එම සලකුණු කාසි මත සටහන් කිරීමෙන් සෞභාග්‍යය, සශ්‍රීකත්වය, ධනය ලැබීම අපේක්ෂා කරන්නට ඇත.” (2015: 175-176).



**රූප සටහන් අංක 09 - දක්ෂිණාවෘතව භ්‍රමණය වූ ස්වස්තික සංකේතය සහ වාමාවෘතව භ්‍රමණය වූ ස්වස්තික සංකේතය - පරිමාණයට නොවේ.**

ස්වස්තික කාසිවල අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ ඇතා, වෘක්ෂය, ස්වස්තිකය, චෛත්‍යය, තුන්කොන් සටහන් දෙකක් එකට බැඳුණු සලකුණ, නන්දිපාදය, අංකුසය, තිත් සලකුණ යනාදී සංකේත දක්නට ලැබෙයි (ඡායාරූප අංක 04-1). මෙම සංකේත පිළිබඳව නාණක විද්‍යාඥයින් සහ පුරාවිද්‍යාඥයින් විසින් විවිධ අර්ථකථන ඉදිරිපත් කොට තිබේ. ඉහත දැක්වූ සංකේත අතුරින් වඩාත් වැදගත් වන්නේ ස්වස්තික සංකේතය යි. එය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

මෙම කාසි වර්ගයේ ප්‍රතිමුඛයේ අනිවාර්යෙන්ම යෙදී තිබීම නිසා ස්වස්තික කාසි නමින් මේ කාසිය හැඳින්වේ. මෙහි දී ස්වස්තිකය වේදියක් සහිතව නිරූපණය කර තිබීම විශේෂ ය. මෙම ස්වස්තික සලකුණ දක්ෂිණාවෘතව මෙන් ම වාමාවෘතව ද භ්‍රමණය වූ ආකාරයෙන් ස්වස්තික කාසිවල යෙදී තිබේ (බලන්න රූප සටහන් අංක 09 සහ ඡායාරූප අංක 04).

කෝඩ්රින්ටන් මෙම සලකුණ 'රේක්කය සහිත ස්වස්තිකය' යනුවෙන් හඳුන්වයි (Codrington, 1924: 20). නමුත් ඩී.පී.ඊ. හෙට්ටිආරච්චි මෙම සලකුණට බෞද්ධ අර්ථකථනයක් ලබා දෙමින් එය 'බෞද්ධ ස්වස්තිකය' ලෙසට හඳුන්වයි (Hettiaratchi, 1965: 227-242). බොහෝ විද්වතුන් මෙය එක්තරා සංකේතයක් ලෙසට සලකමින් අර්ථකථන දීමට උත්සාහ දරද්දී මෙරට ආදි බ්‍රාහ්මී ශිලා ලේඛන ගණනාවක්ම සියුම්ව අධ්‍යයනය කර ඒවායෙහි දක්නට ලැබෙන සංකේත කිහිපයක් පරීක්ෂාවට ලක් කරන සෙනරත් පරණවිතාන, මෙය අනුරාධපුර අවධියේ දී මෙරට ව්‍යවහාරව පැවති චිත්‍රාක්ෂර ක්‍රමයක එක් අක්ෂරයක් ලෙසට පහදා දෙයි (කුලතුංග, 2015: 178). පරණවිතානගේ මෙම විග්‍රහය පිළිබඳව ටී.ජී. කුලතුංග මෙසේ විස්තර කරයි.





ඡායාරූප අංක 04- දක්ෂිණාවෘතව භ්‍රමණය වූ ස්වස්තික සංකේත්ය සහ වාමාවෘතව භ්‍රමණය වූ ස්වස්තික සංකේතය (*Wickramasinhe, 2001*)

> "ගමිණිතිෂ නැමැත්තෙකු විසින් කරනු ලබන පූජාවක් ගැන කියවෙන හෙන්නනේගල විහාරයේ ශිලා ලිපියක ද දෙවනපිය අභයගේ පුත් තිෂ නමැත්තෙකුගේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ලෙන් විහාර බ්‍රාහ්මීය ලිපියක ද ගමිණිතිෂ අභිධානය දැරූ සද්ධාතිස්ස රජුගේ (ක්‍රි.පූ. 137-119) දඹුළු ලෙන් කටාරම් ලිපියේ ද (Ancient Ceylon No 2. p123-124) ඉහත දැක්වූ රේක්කය සහිත ස්වස්තික සළකුණු දක්නට ලැබේ. ඉන්දියාවේ කුනින්ද පාලකයෙකු වූ අමෝඝ භූතිගේ කාසි දෙකක ඇති (පරණවිතාන එස්, සින්දුලේඛණ කියවීමට යෝජිත ක්‍රමයක්, ශ්‍රී සුමංගල) අමෝඝභූතිෂ නම් බ්‍රාහ්මී පාට දෙකක් විමසුමට ලක්කළ පරණවිතාන සූරීහු පළමු පාඨයේ බ්‍රාහ්මීය අක්ෂරයෙන් ලියා ඇති තිෂ යන්න දෙවැනි පාඨයේ දී ස්වස්තික සංකේතයෙන් දක්වා ඇති අයුරු පහදා දෙති. මේ ආකාරයෙන් සාක්ෂ්‍ය දක්වමින් තවත් බ්‍රාහ්මී නොවන සංකේත රාශියක් පිළිබඳ ව නව අර්ථ කථනයන් සපයන මෙතුමා ස්වස්තික සළකුණෙන් "තිෂ" යන්න ද ඊට සම්බන්ධ කොට ඇති රේක්කය හා සමාන සළකුණෙන් පැරණි ග්‍රාමණේය, ග්‍රාමණි, ගමණි ශබ්දය ද සංකේත කොට දක්වා ඇති බව දක්වමින් ඒ අනුව ඉහත කී සංකේතය " ගමිණි තිෂ" යනුවෙන් කියවිය හැකි බව පවසයි." (2015: 179).

පරණවිතාන මෙම අදහස් ඉදිරිපත් කිරීමට පෙර හේරස් පියතුමා සහ සී.ඇල්. ෆැබ්‍රි ශ්‍රී ලංකාවේ කාසිවල දැක්වෙන මෙම සලකුණ චිත්‍රාක්ෂර ක්‍රමයක් විය යුතු බවට අදහස් ඉදිරිපත් කර තිබුණි (කුලතුංග, 2015: 180). ඒ අනුව පරණවිතාන උත්සාහ කළේ එහි වර්ධනීය පියවරක් තබමින් ඒ මතය තහවුරු කිරීමට ය. මෙරට ආදී බ්‍රාහ්මී සෙල්ලිපිවල පසෙකින් කොටා ඇති සංකේත වංශය හෝ කුලය හෝ තත්ත්වය, නිලය හැඟවීමට යොදන ලද බවට ද මතයක් ඉදිරිපත් වී තිබේ. මෙම මතයට පදනම් වන්නේ මඩවල සෙල්ලිපියයි. මඩවල සෙල්ලිපියෙහි රජයෙන් ආචාරි පරමනයාට දෙන දීමනාවක් පිළිබඳව සඳහන් වෙයි. එම ලිපිය ආරම්භයේ පසෙකින් කිනිහිරයක්, අඬුවක් හා මිටියක සලකුණක් කොටා තිබේ. ඒවායින් ඔහුගේ කුල තත්ත්වය කියාපායි. ඒ අනුව පෙනී යන්නේ බ්‍රාහ්මී සෙල්ලිපිවල පසෙකින් කොට ඇති සංකේතය මගින් ලිපිය ලියූ තැනැත්තාව හෝ ඔහුගේ නිල තත්ත්වය ඇඟවීමක් සිදුකරන බව ය (කුලතුංග, 2015: 180). ස්වස්තික කාසි මුලින් ම මෙරටින් සොයා ගත්තේ හෙන්රි පාකර් ද ස්වස්තික සංකේතය රාජකීය මුද්‍රාවක්


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

හෝ සලකුණක් විය හැකි බවට අනුමාන කරයි (Paker, 1999: 492).

'පුරාතන ලංකාවේ බෞද්ධ ස්වස්තික කාසිවල ඇති සංකේත' යනුවෙන් පරණවිතාන සමරු කලාපයට ලිපියක් සපයා ඇති ඩී.ඒ.පී. හෙට්ටිආරච්චි ස්වස්තික කාසිවල යෙදී ඇති අභිමුඛ සංකේත සියල්ල එකවර ගනිමින් බුද්ධ චරිත නිරූපණය කර ඇති බවට අදහස් කරයි (Hettiaratchi, 1965: 227-242). හෙට්ටිආරච්චි එහි දී පෙන්වා දෙන්නේ මෙම ස්වස්තික කාසිවල ප්‍රභවය හා නැඟීම ඉන්දියාවේ කාසිවලට සමානව සිදු නොවුණු අතර ලොව කෙබඳු තැනක හෝ කාසිවල විකාශනයට මෙරට ස්වස්තික කාසි සමාන වන්නේ ද නැති බවයි. මේ අනුව ස්වස්තික කාසි භාවිතය හා පැතිරීම සුවිශේෂී තත්ත්වයක් අත්පත් කර ගනියි. එය නිසැක වශයෙන්ම බුදුදහම හා සම්බන්ධයක් ඇති ස්වදේශික සංකේතයක් බවට හෙට්ටිආරච්චි දැඩිව විශ්වාස කරයි. ස්වස්තික කාසිවල යෙදී ඇති ප්‍රමුඛ සංකේතය වන ස්වස්තිකය පිළිබඳව කොටස් දෙකකින් සාකච්ඡා කර තිබේ. පළමුවැන්න නම් කාසියේ කතිර ලකුණ ගැන ය. දෙවැන්න නම් වමේ සිට දකුණට කැරකී ඇති රාමුවයි. මේ ආකාරයට ස්වස්තිකය ගැන බොහෝ වාද විවාද ඇති වී තිබේ. මෝනියර් විලියම්ස්ගේ අදහස නම් මෙය බොහෝ විට අසම්පූර්ණ චක්‍රයක් බවයි. එයට ගරාදි හතරක් අන්තර්ගත ය (Hettiaratchi, 1965: 235). රාමු හතරකින් යුක්තව තීරු දෙකක් කැපී යන ස්වස්තිකය, බුදුහිමි විසින් මහා සුදස්සන සූත්‍රයේ දේශිත චක්‍ර පිළිබඳ හැඟීමක් ලබා දෙන බවට හෙට්ටිආරච්චි පවසයි. චක්කවත්තී රජ හසුරවන චක්‍රයේ සිව් දිසා පිළිබඳ හැඟීමක් ද ඉන් ලැබේ. ගරාදි හතර බුදුහිමියන් විසින් දම්සක් පැවතුම් සූත්‍රයේ දී දේශිත චතුරාර්ය සත්‍ය විය හැකිය. ස්වස්තිකය ඇතුළාන්තයේ බුදුන්ගේ සම්පූර්ණ මනස අන්තර්ගත වීම මෙහි විශේෂයෙන් දැක්විය යුතුය. සිහින් රේඛා හතර සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන සතර මඟ නිරූපනය කරනවා විය හැකිය (Hettiaratchi, 1965: 236).

ඩී.ඒ.පී. හෙට්ටිආරච්චි ඉදිරිපත් කරන මේ අදහසෙහි දුර්වලතාවක් පවතී. ඔහු ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර තිබෙන්නේ ස්වස්තික සංකේතය කෙරෙහි ය. ඔහු අභිමුඛයේ ම ස්වස්තිකය සමග නිරූපිතව ඇති තුන්කොන් සටහන සහ තිත් සලකුණ පිළිබඳව අවධානය යොමු කර නැත. එම සලකුණු දෙක බෞද්ධාගමට සම්බන්ධ කිරීමට ඔහු අපොහොසත් වී තිබේ (කුලතුංග, 2015: 182). ඇතා සහ ස්වස්තික කාසි වර්ගයේ අභිමුඛයේ දැකිය හැකි සංකේතවලින් පිළිවෙලින් ඇතා ගෙන් උප්පත්තිය ද, වෘක්ෂයෙන් බුදු වීම ද, ස්වස්තිකයෙන් ප්‍රථම ධර්ම දේශනාව ද, චෛත්‍ය සංකේතයෙන් පරිනිර්වාණය ද වශයෙන් බුද්ධ චරිතය පිළිබිඹු වන බවට ඔහු දැක්වූ අදහසට සමාන වන අදහසක් ප්‍රතිමුඛයේ ඇති ස්වස්තිකය, නන්දිපාදය, අංකුසය, චෛත්‍ය ලකුණ ආදී සලකුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර නැත (කුලතුංග, 2015: 182). එමෙන්ම මේ වර්ගයේ කුඩා කාසිවල ඇතා වෙනුවට අශ්වයා සහ සිංහයා දැක්වේ (Codrington, 1924: 22-24). ඔහු ඒ පිළිබඳව ද අදහසක් ඉදිරිපත් කර නැත. මෙවැනි කරුණු නිසා හෙට්ටිආරච්චිගේ අදහස් ඇතැම්හු ප්‍රතික්ෂේප කරති.

ස්වස්තික කාසිවල ඇති සංකේත පිළිබඳව මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි දරන්නේ මහායාන බුදුදහමට නැඹුරු වූ අදහසකි. නීලකණ්ට ශාස්ත්‍රීගේ අදහසක් අනුව යමින් උන්වහන්සේ පෙන්වා දෙන්නේ එම සංකේතවලින් මහායාන බුදුදහමේ වෛරෝචන, රත්න සම්භව, අමිතාභ, අමෝඝසිධි හා අක්ෂොභ්‍ය යන බුදුවරුන් නිරූපණය කෙරෙන බවයි (විමලකිත්ති හිමි, 1969: 13-14). එහෙත් මේ මතය පදනමකින් තොරව ඉදිරිපත් ව ඇති බවට ඇති බවට විවේචන එල්ල වී තිබේ. මන්ද මෙම ස්වස්තික කාසි භාවිත අවධිය වන විට ලංකාවේ මහායාන බුද්ධ පැවැතියා ද? යන්න ගැටලු සහගත වීමයි (කුලතුංග, 2015: 182).

ස්වස්තික කාසි වර්ගයේ ජනප්‍රියතම උපවර්ගය වන ඇතා සහ ස්වස්තික කාසි වර්ගයේ දී ඇත් රූපය අභිමුඛයේ යෙදී ඇති ප්‍රධානතම සංකේතය වේ. වංසකතාගත තොරතුරුවලට අනුව හස්ති රූප මෙරට ජනප්‍රිය වී තිබෙන්නේ ක්‍රි.ව. 2 වන සියවසේ පටන් ය. ඒ එකල ගොඩනැගුණු බෞද්ධ විහාර ආරාමයන්හි කලාත්මක අංගයක් වශයෙනි (ජයවර්ධන, 2014: 112). එහෙත් එම සංකේතය කාසිවල යෙදුවේ කුමන අරමුණකින් ද? යන්න තීරණය කිරීම ගැටලු සහගත ය. ඇතැමුන් පෙන්වා දෙන්නේ සමාජයේ ආගමික වශයෙන් ඇතාට තිබූ තත්ත්වය හා පිළිගැනීම ඊට බලපාන්නට ඇති බවයි. හින්දු සංස්කෘතියට අනුව දෙවිවරුන්ගේ ප්‍රධානියා වන ඉන්ද්‍ර දෙවියාගේ වාහනය ලෙසට සැලකෙන්නේ ඓරාවත නම් ඇතා ය. එම


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ඇතා කිරිමුහුදින් ඉපදුණි (ජයවර්ධන, 2014: 94). හින්දු සාහිත්‍යට අනුව දිග්ගජ නම් ඇතුන් අට දෙනෙකු විසින් මහපොළොව දරාගෙන සිටින අතර ඓරාවත එයින් පූර්ව දිග් භාගයට අධිපතියා වේ. බෞද්ධ සාහිත්‍යයේ ද ඉන්ද්‍ර පිළිබඳව 'ශක්‍ර' වශයෙන් සඳහන් වන අතර ඔහුගේ වාහනය වූ ඇතා පිළිබඳව ද විශේෂ වර්ණනා සිදුකර තිබේ (කුලතුංග, 2015: 183). 'ඓරාවත' යන්නෙහි අර්ථය ජලය ඇත්තා බව හෙන්රිෂ් සීමර්, පරණවිතාන, කඹුරුපිටියේ වනරතන හිමි ආදීහු පෙන්වාදෙති. කෘෂිකාර්මික සමාජයක මිනිසාට ඉතා වැදගත් වන වර්ෂාව ලබා දෙන මේඝය ඇත් රුවින් සංකේතවත් කරන බවට ඔවුහු අදහස් කරති (කුලතුංග, 2015: 183). පන්සිය පනස් ජාතක පොතේ එන වෙස්සන්තර ජාතකයෙහි වෙස්සන්තර රජතුමාගේ 'පණ්ඩර' නම් මංගල හස්තියා වැස්ස ලබා දීමට බලයක් ඇති නිසා අවට රටවල ප්‍රසිද්ධ වී ඇත. කුරුධර්ම ජාතකයෙහි ඇතා මංගල සලකුණක් ලෙස දක්විය (ජයවර්ධන, 2014: 96). එමෙන් ම බෞද්ධ සාහිත්‍යට අනුව සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගැනීම සංකේතවත් කොට තිබෙන්නේ සුදු ඇත් පැටවකු මහමායා දේවියගේ කුසට ඇතුළු වන බව සිහිනෙන් දුටු බව දැක්වීමෙනි. බෞද්ධ සාහිත්‍යයේ බුදුහිමිව හස්තියෙකුට උපමා කොට ඇති අවස්ථා රැසකි. ජෛන සංස්කෘතිය තුළ ද ඇතාට සුවිශේෂීත්වයක් හිමිව තිබේ. ජෛන කල්ප සූත්‍රයෙහි ජෛන මහාවීරතුමාගේ ඉපදීමට ප්‍රථම ත්‍රිශාලා නම් වූ එතුමාගේ මව දුටු සිහින අතර ශ්‍රී ලක්ෂ්මී දෙවඟන ඇතුන් විසින් අභිෂේක කරවන හැටි එක් සිහිනයක දැක්වේ. මේ අනුව හින්දු, බෞද්ධ හා ජෛන යන විවිධ සංස්කෘතිවල ඇතාව සුවිශේෂී සංකේතයක් ලෙස සලකා තිබෙන බව පැහැදිලි ය.

මෙම කාසි වර්ගයෙහි ඇතාව සංකේතවත් කොට තිබෙන්නේ පාලකයා සතු නීත්‍යානුකූල බලය දැක්වීම සඳහා රාජ්‍ය සංකේතයක් වශයෙන් බවට ද අදහසක් ඉදිරිපත් වී ඇත. ඉන්දියාවේ අශෝක අධිරාජයාගේ අවධියේ දී රට පුරා පිහිට වූ ඇතැම් කුලුනු මුදුනේ දක්වා ඇති සත්ත්ව රූප අතර ඇත් රුව දක්නට ලැබේ. සන්කස්ස නුවර පිහිටුවා ඇති අශෝක ස්ථම්භය නිදසුනකි. පුරාණ ලංකාවේ ද මංගල හස්තියා ලබා ගැනීමට අරගල කළ අවස්ථාවක් මහාවංශයෙන් හඳුනාගත හැකිය.

> "තිස්ස කුමර තෙමේ එපවත් අසා දිගා වැවින් ගොස් පියහුගේ ශරීරයට කටයුතු ආදාහනාදිය තෙමේ සකසා කරවා මෑණියන් ද කඩොලැතු ද ගෙණ මහත් බල ඇත්තේ බෑයාට හයින් එතැනින් වහා දිගා වැවට ගියේ ය. එපවත් දන්වන්ට සියලු ඇමතියෝ රැස්ව ලියමන් දී දුටුගැමුණු කුමරු වෙත දූතයන් යැවූහ. ඒ තෙමේ ගුත්තලට අවුත් තිස්ස කුමරු වෙත චරයන් යවා මාගම් එළඹ තමන් රාජ්‍යයෙහි අභිෂේක කෙළේ ය. මෑණියන් පිණිසත් කඩොලැතු පිණිසත් බෑයාට ලියුම් යැවී ය. තුන් යල දක්වා නො ලැබ යුධ පිණිස උහු බලා එළඹියේ ය. චූලංගනිය පිටියෙහි දෙදෙනාගේ මහත් යුද්ධයක් විය." (මහාවංසය සිංහල, 2004: පරි. 24, 14-19 ගාථා).

මේ අකාරයට මංගල හස්තියා ලබා ගැනීම වෙනුවෙන් අරගල කර තිබෙන්නේ මංගල හස්තියා රාජ්‍ය බලයේ සංකේතයක් වීම නිසා බව පැහැදිලිය. අනුප්‍රාප්තිකයෙක් නොමැති ව පාලකයා මිය ගිය කල්හි රජකමට සුදුස්සා තේරීම පිණිස මංගල හස්තියා සරසා යැවීම ද සිදුකර ඇත. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුව රජකමට තෝරා ගැනීමේ දී එම ක්‍රමය යොදා ගත් බවට ජනප්‍රවාදයක් පවතී (කුලතුංග, 2015: 186). මේ අයුරින් බලන විට ඇත් රූපය ආගමික වශයෙන් මෙන්ම රාජ්‍ය පාලන අංශයෙන් ද ඉතා වැදගත් වන බව පැහැදිලිය.

ස්වස්තික කාසිවල තවත් උපවර්ගයක් වූ සිංහයා සහ ස්වස්තික කාසියේ අභිමුඛයේ ඇති ප්‍රමුඛ සංකේතය වන්නේ කේශර රහිත සිංහ රුවයි. සිංහ රුව ද ලොව විවිධ සංස්කෘතිවල සුලබව දැකගත හැකි සංකේතයකි. ග්‍රීක යුගයට පෙර සිටි ක්‍රීට්වරුන්ගේ සයිබිලි නම් දෙවඟන සිංහයන් පිරිවරා ගෙන සිටින ලෙසින් නිරූපිත වේ (ජයවර්ධන, 2014: 124). බලයේ සලකුණක් ලෙස මිනිස් හිසක් සහිත සිංහ රුව ඊජිප්තු ශිෂ්ටාචාරය තුළ නිරූපණය වී තිබේ. පර්සියානුවන්ගේ ජාතික සලකුණ වන්නේ සූර්යා හා සිංහයා ය. ඉන්දියාවේ ද ආන්ද්‍ර කාසි, ඉන්දු-ග්‍රීක කාසි, ශක හා පල්ලව කාසි, ගුප්ත කාසිවල සිංහ රූපය යෙදී තිබේ. ඉන්දියානුවන්ගේ වන්දනයට පාත්‍ර වන දුර්ගා දෙවඟනගේ වාහනය වන්නේ ද සිංහයා ය. බෞද්ධ සංස්කෘතිය තුළ බුදුහිමිගේ අභීත බව උපමා කර තිබෙන්නේ සිංහයෙකුට ය. බුදුහිමිගේ වාග් ශක්තිය



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

උපමා කර තිබෙන්නේ සිංහ නාදයකට ය. ඉන්දියාවේ අශෝක අධිරජු දවස මෞර්ය ස්තම්භ ශීර්ෂවල ද සිංහ රුව යෙදී ඇත. සාංචි, භාර්හුට්, අමරාවතී යන ක්ෂේත්‍රවලින් ද සිංහ රූප සහිත කැටයම්, මූර්ති රැසක් හමුවී තිබේ. ආර්.ජී.ඩී. ජයවර්ධන පවසන්නේ මහින්දාගමනයට පෙර සිට ම සිංහ සංකේතය ලංකාවේ ජනප්‍රියව පැවති බවයි (ජයවර්ධන, 2014: 147). මහාවංසය ට අනුව ලාංකිකයන්ගේ ආදි පුරුෂයා සිංහයෙකි (මහාවංසය සිංහල, 2004: පරි. 6). බුදුදහමේ සහ සිංහල රාජ්‍යයේ දැඩි සම්බන්ධයක් ඇති වූයේ ද සිංහ සංකේතය නිසා බවට ජයවර්ධන අදහස් කරයි (ජයවර්ධන, 2014: 148). මේ අනුව රජය හා ආගම යන දෙපාර්ශවයට ම එකසේ වැදගත් සංකේතයක් වශයෙන් සිංහ රූප මෙරට සංස්කෘතිය තුළ මුල්බැස ගත් බව සිංහ සලකුණු පිළිබඳව විමර්ශනය කිරීමේ දී පෙනීයයි. මෙරට භාවිත කාසිවල ද සිංහ සංකේතය යෙදුණේ එහි ප්‍රතිඵලයක් නිසා විය යුතුය.

ස්වස්තික කාසිවල යෙදෙන තවත් වැදගත් සංකේතයක් වන්නේ වේදිය සහිත වෘක්ෂයයි. මෙය අභිමුඛයෙහි තනිව ප්‍රධාන සංකේතය ලෙස යෙදුණු ස්වස්තික කාසි උපවර්ගයක් ද වෙයි. ඊට අමතරව පොදුවේ සංකේතයක් ලෙස ස්වස්තික කාසිවල යෙදී තිබේ (තවත් සංකේත කිහිපයක් සමග). වෘක්ෂය නිරූපණය කර තිබෙන්නේ වේදිය සහිතව ය. එයින් ඊට පූජනීයත්වයක් එකතු කොට ඇති බවක් හැඟවෙයි. වේදිය සහිත වෘක්ෂ සංකේතයට සපුරාම සමාන වන හෝ සුළු වෙනස්කම් සහිත වන වෘක්ෂ සංකේත උතුරු ඉන්දියාවේ සමකාලීනව මෙන්ම පූර්ව කාලීනව භාවිත වූ කාසිවලින් හඳුනාගත හැකිය. විශේෂයෙන්ම ක්‍රි.පූ. තුන්වැනි සියවසට අයිති උත්තර භාරතීය කාසිවල මේ සංකේතය බහුලව දැකගත හැකිය (කුලතුංග, 2015: 186). පුරාණයේ සිට ම මිනිසුන් අතර පූජනීයත්වයට පත් ස්වභාවිකය වස්තූන් අතර වෘක්ෂය ප්‍රධාන වෙයි. ඉන්දියාවේ වෘක්ෂ වන්දනා පිළිබඳව තොරතුරු හමුවන්නේ ඉන්දුනිම්න අවධියේ සිට ය. එම සභ්‍යත්වයට අයත් මැටි මුද්‍රා අතර වෘක්ෂයට විශේෂත්වයක් දැක්වෙන ආකාරයට නිරූපිත මුද්‍රා පවතියි. එක් මැටි මුද්‍රාවක වැටකින් වට කළ වෘක්ෂය රූපයකි. තවත් මුද්‍රාවක අතුපතර විහිද ගිය වෘක්ෂයක දේවතාවියක් සිටින අතර ගසමුල අඩ දණින් වැටී සිටිමින් ගෞරව කරන රූපයකි. අශෝක ගස කාන්තාවන්ට දරුවන් ලබාදීමට බලයක් ඇති ගසක් ලෙසට හින්දූහු විශ්වාස කරති. නුග, තුල්සි, දිඹුල් ආදී ගස් වර්තමානයේ දී පවා ඉන්දියානුවන්ගේ වන්දනාවට පාත්‍ර වේ. ඉන්දියානු කාසිවල නිරූපිත වෘක්ෂ සංකේතවලින් දැක්වෙන්නේ පැරණි හින්දු සාහිත්‍යයේ සඳහන් චෛත්‍ය වෘක්ෂ හා ස්ථාල වෘක්ෂ බව ජේ.එන්. බෙනර්ජි අදහස් කරයි (කුලතුංග, 2015: 188). එස්.එස්. සිං පවසන්නේ ක්‍රිස්තු පූර්ව යුගයේ භාරතීය කාසිවල වෘක්ෂ සටහන් යෙදුනේ ආගමික වැදගත්කම නිසා ම පමණක් නොවේ. තාම ආහාරපානාදියේ දී විශේෂ ස්ථානයක් ගත් වෘක්ෂලතාදිය ද දැක්වීමේ අරමුණින් ද වෘක්ෂ සංකේත කාසිවල දක්වා ඇති බවට සිං අදහස් කරයි (කුලතුංග, 2015: 188). ශ්‍රී ලංකාවේ පැරණි කාසිවල දැක්වෙන වෘක්ෂ සංකේතය උතුරු ඉන්දියාවේ කාසි අනුකරණය කිරීම නිසා යෙදූ බවට බොහෝ විද්වත්හු විශ්වාස කරති (කුලතුංග, 2015: 188). ලංකාවේ මහින්දාගමනයට පෙර සිට ම වෘක්ෂ වන්දනා පැවතුණු බවට මහාවංශයේ පණ්ඩුකාභය වෘතාන්තය මගින් පැහැදිලි වේ (මහාවංසය සිංහල, 2004: පරි. 10). නමුත් ලාංකිකයන් වෘක්ෂ ඇදහිල්ලට එතරම්ම නැඹුරුව සිටි බවට ඉදිරිපත් කළ හැකි වෘක්ෂ සටහන් නොමැත (ජයවර්ධන, 2014: 185). මහින්දාගමනයෙන් පසුව ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් මෙරටට ගෙන්වීමෙන් පසුව බෝධි වන්දනාව මෙරට ජනප්‍රිය විය. ඒ අනුව යමින් කෙනෙකුට මෙම ස්වස්තික කාසිවල යෙදෙන වෘක්ෂ සංකේතය මගින් ශ්‍රී මහා බෝධිය සංකේතවත් කරන බවට තර්ක කළ හැකිය (කුලතුංග, 2015: 189). එහෙත් ඒ පිළිබඳ නිශ්චිත නිගමනයකට එළඹීමට අපහසුය. ආර්.ජී.ඩී. ජයවර්ධන පවසන්නේ වෘක්ෂ සටහන් කාසි ගනුදෙනු සඳහා භාවිත වුව ද ඒවායේ යෙදී ඇති සලකුණු බොහෝ විට ආගමික හෝ වංශ චිහ්න වැනි අදහස්වලට සම්බන්ධ බවයි (ජයවර්ධන, 2014: 185). දකුණු ඉන්දියාවේ තම්බපණ්ණි සහ වේගී ගංගා දෙපස පිහිටි ගම්මානවලින් මේ වර්ගයේ කාසි හමු වී ඇති බවට ප්‍රකාශ කරන ඩොඩ්වෙල් මේවා ක්‍රිස්තු පූර්ව දෙවැනි හෝ තුන්වැනි ශතවර්ෂයන්ට අයත් බෞද්ධ කාසි වන බවට පෙන්වා දෙයි. බොහෝ විට වේදිකාවකින් වට කරන ලද බෝධි වෘක්ෂයක් වශයෙන් මෙම සංකේතය හඳුන්වා දිය හැකිය (වනිගසේකර, 1987: 63). පරණවිතාන සමරු කලාපයට ලිපියක් සපයමින් ඩී.පී.ඊ. හෙට්ටිආරච්චි මෙම වෘක්ෂ සලකුණින් ගෞතම බුදු හිමිගේ බුදුවීම සංකේතවත් කරන බවට දක්වයි (Hettiaratchi, 1965: 227).


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ස්වස්තික කාසිවල දක්නට ලැබෙන තවත් සංකේතයක් වන්නේ පර්වත සංකේතයයි. මෙය චෛත්‍ය සංකේතය, කන්ද සංකේතය යනුවෙන් ද ඇතැම්හු හඳුන්වති. ස්වස්තික කාසිවල අභිමුඛ, ප්‍රතිමුඛ දෙපැත්තේම යෙදී තිබෙන සංකේතයකි. පහත රූප සටහන් අංක 10හි දැක්වෙන ආකාරයට සුළු වෙනස්කම් සහිතව ද මෙම සංකේතය යෙදී තිබෙනු හඳුනාගත හැකිය.




**රූප සටහන් අංක 10 - පර්වත සංකේතය විවිධත්වයකින් යෙදී ඇති ආකාරය - පරිමාණයට නොවේ.**

දේශීය විද්වත්හු මෙම සලකුණ චෛත්‍ය හෝ ස්තූපය ලෙසට හඳුන්වති (කුලතුංග, 2015: 190). මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි පවසන්නේ මෙය හින්දූන්ගේ ත්‍රිකූට පර්වතය විය යුතු බවයි (විමලකිත්ති හිමි, 1969: viii). මෙයින් බුද්ධ පරිනිර්වාණය හා ධාතු නිධන් කිරීම දැක්වෙන බව ද අඩකව තුනෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම පිළිබිඹු කෙරෙන බව ද ඩී.පී.ඊ. හෙට්ටිආරච්චි අදහස් කරයි (Hettiaratchi, 1965: 227). ක්‍රි.පූ. 3 හෝ 4 වන සියවසේ පටන් ශත වර්ෂ කිහිපයක් දක්වා ඉන්දියාවේ භාවිත වූ කාසිවල ද ලංකාවේ හස්ළුබ්බූ කාසිවල ද මේ සංකේතය නොවෙනස්ව හෝ සුළු වෙනස්කම් සහිතව හෝ සටහන්ව තිබෙනු හඳුනාගත හැකිය. ඉන්දියානු කාසිවල දැක්වෙන මේ සලකුණින් පැරැන්නන්ගේ ආගමික විශ්වාසයන්ට පාත්‍ර වූ කඳු හා පර්වත සංකේතවත් කර වන බවට මෑත කාලයේ දී උගතුන් විසින් අදහස් දක්වා තිබේ (කුලතුංග, 2015: 190). ඉන්දියානු කාසි සමහරෙක ශිඛර මුදුනේ මොනරෙක් වැනි සත්ත්වයෙකුගේ සංකේතයක් ද දක්නට ලැබේ. මෙම සංකේතය ලංකාවේ කාසිවලට යෙදීමේ ආභාසය ලැබී තිබෙන්නේ මෙම ඉන්දීය කාසිවලින් බව පෙනේ. මේ අනුව බලන විට මෙම සංකේතය චෛත්‍යක් ලෙසට හැඳින්වීම ගැටලු සහගතය. මන්ද ඒ මත සත්ත්ව සංකේතයක් යෙදීම නොගැළපෙන බැවිනි. ලංකාවේ ස්වස්තික කාසිවලට පෙර භාවිත වූ හස්ළුබ්බූ කාසිවල ද අඩ කව ත්‍රිත්වයක් එකට දැක්වෙන මෙම සංකේතය සමග එහි මුදුනේ සත්ත්ව රූපයක් සහිතව නිරූපණය වී තිබෙනු හඳුනාගත හැකිය. මේ අනුව පැහැදිලි වන්නේ ස්වස්තික කාසිවල යෙදෙන මෙම සංකේතය චෛත්‍යයක් ලෙසට හැඳින්විය නොහැකි බවයි. ඉන්දියානු හස්යෙදූ කාසි සමහරෙක මෙම සංකේතය මුදුනේ අඩසඳ සලකුණ දැකිය හැකිය. ඒ අනුව මෙයින් ශිවගේ වාසභවන වූ හිමාලයේ කෛලාස පර්වතය සංකේතවත් කරන බවට ද අදහසක් පවතියි. ලංකාවේ ද මහින්දාගමනයට පෙර පර්වත ඇදහීම තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. සමනලකන්ද බෞද්ධයින්ගේ පූජනීය ස්ථානයක් බවට පත්වූයේ එම පර්වත වන්දනය බෞද්ධ ඌරුවට හැඩගැසීම නිසා විය යුතුය (කුලතුංග, 1987: 38). කෙසේනමුත් මෙම සංකේතය මගින් ලාංකිකයන්ගේ ආගමික විශ්වාස පිළිබිඹු කරනවාට වඩා මෙරට පැරණි කාසි නිෂ්පාදනයට ලැබුණු ඉන්දීය ආභාසය මෙයින් ප්‍රකට කරවන බවට සිතීම වඩාත් යෝග්‍ය වේ.

ස්වස්තික කාසිවල අභිමුඛයෙහි දක්නට ලැබෙන තවත් සංකේතයක් වන්නේ තුන්කොන් සටහනයි. මෙම සංකේතය කාසියක යෙදීමේ අරමුණ අපැහැදිලි ය. මේ පිළිබඳව ද විවිධ අදහස් පවතියි. ජෝන් ස්ටීල් මෙයින් හින්දු භක්තිකයන්ගේ ලිංග පූජාව නිරූපිත බවට අදහස් කරයි. ඒ මෙම සංකේතයෙහි ත්‍රිකෝණ රූපය හා ඒ මත පිහිටි කුලුනකට සමාන ලකුණ අවධානයට ගනිමිනි (කුලතුංග, 2015: 192). කොඩ්රින්ටන් මෙම සංකේතය බැහැර කර තිබෙන අතර මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි මෙයින් චෛත්‍ය සංකේතවත් කෙරෙන බවට අදහස් කරයි (විමලකිත්ති හිමි, 1969: viii).

එකට බැඳුනු තුන්කොන් සටහන් දෙක ද ස්වස්තික කාසිවල ප්‍රතිමුඛයේ යෙදී ඇති සංකේතයකි. ඉන්දීය හස්යෙදූ කාසිවල ද මේ සංකේතය දක්නට ලැබේ. නමුත් ඒ පිළිබඳ විස්තර නොමැත. පුරාණ ඉන්දියාවේ සහ ලංකාවේ අනුරාධපුර යුගයේ දී සිරිපතුල් ගල්වල ස්වස්තික, ඡත්‍ර, චාමර, සංඛ ආදී වශයෙන් මංගල වස්තු දැක්වීමේ දී මෙම සලකුණ ද දැක්වේ (කුලතුංග, 2015: 193). ඒ අනුව මෙය මංගල සම්මත ලකුණක් බවට අනුමාන කළ හැකිය. ටී.බී. කරුණාරත්න මෙමගින් කුස තණ මිටියක් මැදින් බැද සාදාගන්නු ලබන යෝගීන්ගේ

භද්‍රාසනය නොහොත් භද්‍රපීඨය සංකේතවත් කරන බව දක්වයි (කුලතුංග, 2015: 194).



රූප සටහන් අංක 11 - නන්දිපාද සලකුණ විවිධත්වයකින් යෙදී ඇති ආකාරය - පරිමාණයට නොවේ.

ස්වස්තික කාසිවල දක්නට ලැබෙන තවත් සංකේතයක් වන්නේ නන්දිපාදයයි. මෙම සංකේතය ද ඉහත රූප සටහන් අංක 11හි දැක්වෙන ආකාරයෙන් විවිධාවයකින් යුක්තව ස්වස්තික කාසිවල යෙදී තිබේ. නන්දිපාදය යනු කවයක් මත උඩ අතට අර්ධකවක් නිරූපිත සංකේත යයි. මීට සමාන සලකුණක් ඉන්දුනිම්න මුද්‍රාවල ද, ඉන්දීය ධරණ කාසිවල ද දැක්වේ. මෙම සංකේතය බ්‍රාහ්මී අක්ෂර මාලාවේ දැක්වෙන ‘ම’ අක්ෂරයේ ස්වරූපයට සමාන ය. ටී.ජී. කුලතුංග පවසන්නේ මෙය පැරණි ශිෂ්ටාචාරයන්හි විශ්වාසයට පාත්‍ර වූ යම් ආගමික සලකුණක් බවට පිළිගැනීම වඩාත් යෝග්‍ය බවයි (කුලතුංග, 2015: 198). ජෝන් මාෂල් මෙයින් වෘෂභ හිස සංකේතවත් කරන බවත් බී. චට්ටොපාද්‍යාය මෙය සශ්‍රීකත්වය පිළිබඳ විශ්වාසයේ සළකුණක් බවත් දක්වයි (කුලතුංග, 2015: 198). මෙයින් සූර්යා සහ චන්ද්‍රයා සංකේතවත් වන බවටත් සැලකේ. ආනන්ද කුමාරස්වාමි අදහස් කරන්නේ වජ්‍ර හා අග්නි සමග මෙම සංකේතයේ සම්බන්ධතාවයක් පෙන්වන බවයි (කුලතුංග, 2015: 198).

ස්වස්තික කාසි සමහරෙක නන්දිපාද සලකුණ වෙනුවට ත්‍රිශූල සලකුණ යෙදී ඇත. මෙය ප්‍රසිද්ධව තිබෙන්නේ ත්‍රිරත්න සංකේතය වශයෙනි. මෙය නන්දිපාද සලකුණට සමානව වර්ධනය වූ සලකුණක් හැටියට ඇතැම්හු පෙන්වාදෙති (කුලතුංග, 2015: 199). මීට සමාන සංකේත ලංකාවේ ප්‍රොටෝ ඓතිහාසික සංස්කෘතියට අයත් සුසාන භූමිවලින් සොයා ගෙන ඇති මැටි මෙවලම්වල ද දැකිය හැකිය (ජයවර්ධන, 2014: 298). පොදුවේ සලකන විට මෙරට පැරණි ත්‍රිශූල සටහන්වලින් බලය, රාජ්‍යත්වය, මරණින්මතු උපත නිරූපණය වන බවට ආර්.ජී.ඩී. ජයවර්ධන පවසයි (ජයවර්ධන, 2014: 299).

ස්වස්තික කාසිවල අභිමුඛයේ මෙන් ම ප්‍රතිමුඛයේ ද කිහිපවරක් ම තිත් තුනේ සංකේතය යෙදී තිබේ. සෙසු සංකේතවලට සාපේක්ෂව මෙය කෙරෙහි නාණක විද්‍යාඥයින් දක්වා ඇත්තේ අඩු අවධානයකි. මෙය බ්‍රාහ්මී අක්ෂර මාලාවේ ‘ඉ’ අක්ෂරයට සමාන ය. බහුතර පිළිගැනීම වන්නේ මෙම සංකේතය යොදා ගෙන තිබෙන්නේ කාසියේ හිස් අවකාශය පූර්ණය කිරීමට බවයි. නමුත් මේ සංකේතය මෙරට භාවිත සිංහ කාසි, වෘෂභ කාසි, යාපනයේ සේතු කාසි වැනි කාසි වර්ග කිහිපයකම දැකගත හැකිය. මේ අනුව මෙම සංකේතය හුදෙක් හිස්තැන් පිරවීමට පමණක් යොදාගත් සංකේතයක් වශයෙන් ගෙන සැලකීම උචිත නොවේ. ශිවගේ ත්‍රිමූර්තිය, ශ්‍රී යන්ත්‍රය, ත්‍රිපුර සුන්දරී යනාදී සංකල්ප සංකේතවත් වන බවට ද අදහස් ඉදිරිපත්ව තිබේ (කුලතුංග, 2015: 203-204).

වේදිය සහිත ස්වස්තිකය, වේදිය සහිත වෘක්ෂය, ඇතා, සිංහයා, අශ්වයා, නන්දිපාදය, එකට බැඳුනු තුන්කොන් සටහන් දෙක, පර්වත සංකතේය, තිත් තුන යනාදී සංකේත රැසක් ම ඒකීයත්වය තුළ විවිධත්වයකින් යුක්තව ද විවිධත්වය තුළ ඒකීයත්වයකින් යුක්තව ද ස්වස්තික කාසිවල යෙදී තිබෙනු හඳුනාගත හැකිය. ස්වස්තික කාසිවල යෙදී තිබෙන මෙම සංකේත පිළිබඳව විද්වතුන් විවිධ අදහස් හා අර්ථකථන රැසක් ඉදිරිපත් කර තිබේ. මේ වන තෙක් මෙම කාසි වර්ගයෙහි නිරූපිත සංකේතවලින් ප්‍රකාශිත අර්ථය පිළිබඳ පිළිගත් වාස්තවික අර්ථකථනයක් නොමැත.

## 5. සමාලෝචනය

පුරාණ ශ්‍රී ලංකාවේ භාවිත වූ මුදල් වර්ග පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී හස්යෙදූ කාසිවලින් පසුව මෙරට භාවිත වන්නේ ස්වස්තික කාසි ය. මෙම ස්වස්තික කාසි අනුරාධපුර මුල් අවධියේ දී මෙරට භාවිත වූ කාසි අතරින් වඩාත් ප්‍රසිද්ධ ම කාසි වර්ගය හැටියට සැලකෙයි. මෙම කාසි වර්ගයට එම නාමය ලැබීමට බලපා තිබෙන්නේ එහි ඇතුළත් ස්වස්තික සංකේතය යි. ස්වස්තික සලකුණ මෙම කාසි වර්ගයේ ප්‍රතිමුඛයෙහි අනිවාර්යෙන්ම යෙදී ඇත. මෙම කාසි වර්ගයෙහි දක්නට ලැබෙන සංකේත පිළිබඳ විද්වතුන්ගේ වැඩි


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

අවධානයක් යොමු ව තිබේ. වටකුරු හා හතරැස් හැඩයෙන්, තඹ ලෝහය නිෂ්පාදන මාධ්‍ය කොටගත් මෙම කාසි වර්ගයෙහි අභිමුඛයේ සංකේත පහක් ද ප්‍රතිමුඛයේ සංකේත හතරක් ද යෙදී ඇත. අධ්‍යයනයේ පහසුවට වත්මන් නාණක විද්‍යාඥයෝ අභිමුඛයේ ඇති ප්‍රධාන සංකේතයක් මුල් කොට ගෙන මෙම ස්වස්තික කාසි උපවර්ග හතරකට බෙදති. ගස සහ ස්වස්තික කාසි, ඇතා සහ ස්වස්තික කාසි, අශ්වයා සහ ස්වස්තික, සිංහයා සහ ස්වස්තික යනුවෙනි. මෙම සෑම වර්ගයකම ප්‍රතිමුඛයෙහි අනිවාර්යෙන්ම ස්වස්තික සංකේතය යෙදී ඇත. ඇතැම් විට අභිමුඛයේ ද ස්වස්තික සංකේතය දක්වේ. වේදිය සහිත ස්වස්තිකය, පර්වතය, ත්‍රිකෝණ සංකේතය, වේදිය සහිත ගස මෙන්ම උපවර්ගවලට බෙදීමට මූලික කොටගත් අලියා, සිංහයා, අශ්වයා යන සත්ත්ව රූප ද අභිමුඛ සංකේත ලෙසින් ස්වස්තික කාසිවල යෙදී තිබේ. ගස සහ ස්වස්තික කාසිවල අභිමුඛයේ යෙදී තිබෙන්නේ වේදිය සහිත වෘක්ෂය පමණි. එහි ප්‍රතිමුඛයේ වේදිය සහිත ස්වස්තිකය, කන්ද සංකේතය, නන්දිපාද, ත්‍රිකෝන සටහන යන සංකේත හතර යෙදී තිබේ. ස්වස්තික කාසිවල යෙදෙන මේ එක් එක් සංකේතවලින් අදහස් වන්නේ කුමක්ද? යන්න පිළිබඳව මේ වන තෙක් නිශ්චිත අදහසක් ඉදිරිපත් වී නැත. මේ පිළිබඳව විවිධ විද්වතුන් විවිධ අදහස් හා අර්ථකථන ඉදිරිපත් කොට ඇති බවට මෙම ලිපියෙහි ඉහත විස්තරවලින් පැහැදිලි වේ. පරණවිතානට අනුව වේදිය සහිත ස්වස්තික සංකේතය අනුරාධපුර අවධියේ දී මෙරට පැවති චිත්‍රාක්ෂර ක්‍රමයක එක් අක්ෂරයකි. ඩී.පී.ඊ. හෙට්ටිආරච්චි පවසන්නේ එමගින් බුදු හිමිගේ ප්‍රථම ධර්ම දේශනාව සංකේතවත්වත් කරන බවයි. මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියෝ මහායාන බුදුවරු පස්දෙනෙකු ඉන් නිරූපිත වන බවට අදහස් කරති. මෙම ස්වස්තික සංකේතය බෞද්ධ ස්වස්තිකයක් ලෙසට ඇතැම්හු හඳුන්වති. නමුත් ස්වස්තික සංකේතය ලෝකයේ විවිධ සංස්කෘතිවල සුබ සලකුණක් ලෙස සලකා ඇති බැවින් එය හුදෙක් බෞද්ධාගම පමණක් සීමා කොට දැක්වීම කොතෙක්දුර තිවැරදි ද? යන්න පිළිබඳව සිතා බැලිය යුතුය. ස්වස්තික කාසිවල යෙදී ඇති ඇත් රුව ආගමික හෝ රාජ්‍ය පාලන අංශය සංකේතවත් කරමින් යෙදුණු බවට සිතිය හැකිය. වේදිය සහිත වෘක්ෂ සලකුණ පුරාණ කාලයේ පැවති වෘක්ෂ වන්දනා පිළිබඳව වන සංකේතයක් ලෙසට සැලකේ. පර්වත සංකේතය කාසියේ දෙපැත්තේම සටහන්ව තිබෙන අතර මෙය චෛත්‍යක් ලෙස ද පර්වතයක් ලෙස ද අර්ථකථනයට බඳුන් වී තිබේ. මෙම සංකේතයෙන් ශිව දෙවියාගේ වාසභවන නිරූපනය කරන බවට ද අදහසක් පවතී. ත්‍රිකෝණ සංකේතය මගින් හින්දූන්ගේ ලිංග පූජාව නිරූපණය කරන බවට ජෝන් ස්ටීල් පවසයි. විමලකිත්ති හිමි පවසන්නේ එයින් චෛත්‍යය සංකේතවත් වන බව ය. එකට බද්ධ වූ ත්‍රිකෝණ සටහන් දෙකෙන් කුස තණ මිටියක් මැදින් බැඳ සාදාගන්නා යෝගීන්ගේ භද්‍රාසනය සංකේතවත් කරන බවට ටී.බී. කරුණාරත්න පෙන්වා දෙයි. නන්දිපාද සංකේතයෙන් වෘෂභ හිස සංකේතවත් කරන බවට ජෝන් මාෂල් පවසයි. ආනන්ද කුමාරස්වාමිගේ අදහස් කරන්නේ එයින් වජ්‍ර සහ අග්නි නිරූපිත බවයි. ත්‍රිරත්න සංකේතයෙන් බුද්ධ, ධම්ම, සංඝ සංකේතවත් කරන බවට බොහෝ උගත්හු විශ්වාස කරති. එය ත්‍රිශූලය බවට ස්ටීල් කල්පනා කරයි. කාසියේ හිස් අවකාශය පිරවීමට තිත් සලකුණ යොදා ගෙන ඇති බවට වැඩි දෙනාගේ අදහස වේ. නමුත් හින්දු විශ්වාසයට අනුව ශිවගේ ත්‍රිමූර්තිය, ශ්‍රී යන්ත්‍රය, ත්‍රිපුර සුන්දරී ආදී සංකල්ප ඉන් ප්‍රකාශිත බවට ද අදහස් ඉදිරිපත් වී ඇත. තවද මෙයින් කාසියේ වටිනාකම හැඟවෙන බවට ද ඇතැම්හු තර්ක කරති. මෙම ස්වස්තික කාසිවල දක්නට ලැබෙන සංකේත උතුරින් ඉන්දියාවේ කාසිවල ද දක්නට ලැබෙන බැවින් ඇතැම් උගත්හු මෙම සංකේතවලින් සමකාලීන ඉන්දියානු කාසි අනුකරණය කිරීමක් පිළිබිඹු කරන බවට ද පෙන්වාදෙති. කෙසේනමුත් ස්වස්තිකය මුල් කොට ගෙන ස්වස්තික කාසි ලංකාවට ම ආවේණික කාසි වර්ගයක් බවට ඇතැම්හු තර්ක කරති. මේ ආකාරයට ස්වස්තික කාසිවල ඇති සංකේත පිළිබඳවත්, ඒවා පදනම් කර ගෙන මෙරට කාසි භාවිතය පිළිබඳවත් විද්වතුන් අතර අදහස්, අර්ථකථන සහ මතවාද රාශියක් පවතින බව පැහැදිලි වේ. මේ පිළිබඳව පිළිගත හැකි වාස්තවික අදහසක් නොමැත. මෙවන් පසුබිමක දී හුදෙක් ස්වස්තික සංකේතය පමණක් පදනම් කර ගනිමින් එය බුදුදහම සමග සම්බන්ධ කර එම කාසිවල සෙසු සංකේත යොදා ගැනීමේ අදහස හෝ අර්ථය පිළිබඳව අඩු අවධානයක් යොමු කොට ස්වස්තික කාසි ස්වදේශික කාසි වර්ගයක් ලෙසින් අර්ථකථනය කළ නොහැකි ය.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

## ආශ්‍රිත මූලාශ්‍රය


- කල්දේරා, ලීලානන්ද. (1959). **ලංකාවේ මිල මුදල්.** කොළඹ: කොළඹ ජාතික කෞතුකාගාරය.

- කුලතුංග, ටී.ජී. (1997). "ඇතා සහ ස්වස්තික කාසි", ඒ. ඒකනායක (සංස්.), **විද්‍යෝදය සමාජීයවිද්‍යා සංග්‍රහ.** නුගේගොඩ: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

- කුලතුංග, ටී.ජී. (1998). "ශ්‍රී ලංකාවේ භාවිත දේශීය කාසි", ඩී.කේ. රත්නසිරි සහ නෙල්දන් ද සිල්වා (සංස්.), **විද්‍යාරණී 97-98.** නුගේගොඩ: ඉතිහාසය හා පුරාවිද්‍යා සංගමය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

- කුලතුංග, ටී.ජී. (2015). **ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය.** කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

- ගුණරත්න, ජී. ධම්මික. (2019). **කාසියේ අසිරිය.** කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව.

- ජයවර්ධන, ආර්.ජී.ඩී. (2014). **දකුණු ආසියානු බෞද්ධ කලාවේ සංකේත.** වරකපොල: ආරිය ප්‍රකාශකයෝ.

- ජයසිංහ, කරුණාරත්න. (2013). **ශ්‍රී ලංකාවේ පුරාණ මුදල් සහ වෙළඳ ගනුදෙනු.** මීරිගම: ආශිර්වාද ප්‍රකාශන.

- සිල්වා, ජී.පී.එස්.එච්. (2018). **ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් ක්‍රමයේ ඉතිහාසය.** පරි. නිමල් ලාලිත රත්නසේකර. බොරගැස්ගමුව: කතෘ ප්‍රකාශනයකි.

- බාලසූරිය, ඉනෝකා. (2000). "ජේතවන බිමෙන් හමුවන අපේ කාසි", ඇරණ රාජපක්ෂ සහ පී.පී. සමින්ද කුමාර (සංස්.), **වැලිපිළ පුරාවිද්‍යා සඟරාව 4 වන කලාපය.** කොළඹ: ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය මධ්‍යම සංස්කෘතික අරමුදල.

- බාලසූරිය, ඉනෝකා. (2008). **පැරණි මුදල්.** කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

- බාලසූරිය, ඉනෝකා. (2009). "ජේතවන ස්තූප බිමෙන් හමුවූ පැරණි කාසි", පියතිස්ස සේනානායක (සංස්.), **ජේතවන ස්තූප පුරාණ සමරු කලාපය.** කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

- **මහාවංසය සිංහල.** (2004). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්.), දෙහිවල: අජිත් ප්‍රින්ටර්ස්.

- වනිගසේකර, දමයන්ති කුමාරි, (1987). **පැරණි ලංකාවේ කාසි පිළිබඳ විචාරාත්මක සමීක්ෂණයක්.** පේරාදෙණි විශ්වවිද්‍යාලය: ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත්කරනු ලබන නිබන්ධය, අප්‍රකාශිතයි.

- විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ. (1969). **ලංකාවේ කාශි හා මුදල් ව්‍යවහාරය.** කොළඹ: සුමන මුද්‍රණාලය.

- විරාජිනී, කේ.ඩබ්.එම්.එච්. (2010). "ඇතා සහ ස්වස්තික කාසි වර්ගීකරණය", මුදිත කරුණාමුනි (සංස්.), **ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා වෙළුම 4.** කොළඹ: පුරාවිද්‍යා සංගමය.

- සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (2014). **රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි.** කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

- මැදගම, හේරත් බණ්ඩාර කේ.එම්. (2009). **ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් නෝට්ටුවල ඉතිහාසය සහ සන්නිවේදන ලක්ෂණ.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

- Codrington, H.W. (1924). **Ceylon Coins & Currency**. Colombo: A.C. Richards Acting Government Printer.

- Deraniyagala, S. (1972). "The Citadel of Anuradhapura 1969: Excavations in the Gedige Area", Commissioner of Archaeology (Ed.), **Ancient Ceylon No. 02**. Colombo 07: Department of Archaeology Sri Lanka.

- Hettiaratchi, D.P.E. (1965). "The Symbols on the 'Buddhist' Svastika Coins of Ancient Ceylone", N.A. Jayawickrama (Ed.), **Paranavitana Felicitation Volume on Art & Architecture and**

**Oriental Studies**. Colombo: M.D. Gunasena & Co. Ltd.

- Paeker, Henry. (1999). **Ancient Ceylon.** New Delhi: Jaya Print Pack Pvt. Ltd.
- Rapson, E.J. (1897). **Indian Coins**. Strassburg: K.J. Trubner.
- *Wickramasinhe, Rajah M. 2001, "Minted legacy", in coins.lakdiva.org*, viewed 07 February 2023, *from* https://coins.lakdiva.org/media/cdn_2001.06.10_2200years_of_coins.html


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk